# මූලික පිරිවෙන් අවසාන විභාගය

# ඇගයීම් වාර්තාව

## 02- පාලි

## 2020

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක හෝ අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවේණාචාර්යවරු ද ඇඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මූලික පිරිවෙන් අවසාන විභාගය 2020 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තා ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවේණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත.
මූලික පිරිවෙන් පාලි විෂයයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මකව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I පත්‍රයේ ව්‍යුහය, I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය, I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේ ද I ප්‍රශ්න පත්‍රයට අදාළ ව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමනය හා යෝජනා ද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතර හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කරගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රියව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමු කරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2023 ජූනි 30
පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

## පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබාදීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මූලික පිරිවෙන් අවසන් විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා, පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරීන්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඩී. ඩී. වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| විෂය සම්බන්ධීකරණය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සංස්කරණය | : | පූජ්‍ය මාවතවැවේ රතනවංශ හිමි<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>උතුරු මැද පළාත.<br><br>පූජ්‍ය මැටිබැඹියේ සුමනසාර හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලි)<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඉසුරුපාය. |
| ලේඛක මණ්ඩලය | : | පූජ්‍ය මාවතවැවේ රතනවංශ හිමි<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>උතුරු මැද පළාත.<br><br>පූජ්‍ය මැටිබැඹියේ සුමනසාර හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලි)<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඉසුරුපාය.<br><br>පූජ්‍ය ගල්වඩුවාගම සීලානන්ද හිමි<br>පරිවෙණාධිපති<br>අනු/ශ්‍රී සදානන්ද මහා පිරිවෙන<br>පෙරියකුලම, මරදන්කඩවල |
| පරිගණක පිටපත සැකසුම | : | කේ. ඒ. ඉරෝෂා බණ්ඩාර<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර 3-II |
| පිටකවරය නිර්මාණය | : | ආර්.එම්. නිලුපුල් ශෙහාන් යසරත්න<br>දත්ත සටහන් සහකාර |

# පටුන

**පිටු අංකය**


1. පාලි විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු
    - 1.1 පාලි විෂයය අධ්‍යයනයේ අරමුණු 01
    - 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු 02
        - 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 02
        - 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 02
        - 1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 03
        - 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 04

I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු 05
    - 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 06
    - 2.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න 1 සිට 40 දක්වා) 07
    - 2.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 13
    - 2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය 10
    - 2.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 15
    - 2.6 තේමා අනුව I ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය 16
    - 2.7 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 19

II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු 21
    - 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 21
    - 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 22
    - 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 22
    - 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 23
    - 3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය 24
    - 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය, ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 40

4. පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු 41
5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා 42

## 1 පාලි විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 පාලි විෂයය අධ්‍යයනයේ අරමුණු

1. පාලි භාෂාව නිවැරදි ව උච්චාරණය කිරීමේ හා ලිවීමේ හැකියාව ඇති කිරීම
2. පාලි භාෂාවේ අක්ෂර වින්‍යාසය, විවිධ පද, විවිධ වාක්‍ය රටා හා රචනය හුරු කිරීම
3. පාලි ගද්‍ය පද්‍ය පාඨ මාතෘ භාෂාවටත් මාතෘ භාෂාවෙන් පාලි භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව ඇති කිරීම
4. පාලි සාහිත්‍යය පිළිබඳ අවබෝධයක් ලබා දීම හා එහි එන ජීවන දර්ශනය උපයෝගී කර ගනිමින් මනා පෞරුෂයකින් යුත් චරිතයක් බිහි කිරීම
5. ත්‍රිපිටකාගත හරධර්ම චරිතායනය කෙරෙන ආදර්ශවත් භික්ෂු පරපුරක් රටට දායාද කිරීම
6. පාලි භාෂාව පිළිබඳ දැනුම සිංහල භාෂා ඥානයේ ප්‍රවීණත්වය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් බව තහවුරු කිරීම
7. පාලි භාෂාව තමන්ගේ මෙන් ම ජාතියේ ද සිය රටේ ද උරුමයක් බව තහවුරු කිරීම
8. ත්‍රිපිටකය හැදෑරීම සඳහා පාලි භාෂාව මූලික අවශ්‍යතාවක් බව අවධාරණය කිරීම
9. ත්‍රිපිටකය හා අටුවා පරිශීලනය කරමින් ධර්මය නිවැරදි ව අර්ථකථනය කරන භික්ෂු පිරිසක් ශාසනයට දායාද කිරීම
10. ත්‍රිපිටක බුද්ධ වචනය නිවැරදි ව ග්‍රහණය කිරීම පිණිස ඇති ඒකායන මාර්ගය පාලි භාෂාව ඉගෙනීම බව පසක් කිරීම
11. බුද්ධ වචනය සුරක්ෂිතව ඉදිරියට පවත්වාගෙන යෑමට ප්‍රතිබල සම්පන්න උතුමන් පිරිසක් බිහි කිරීම
12. මහාවිහාරීය භික්ෂු සම්ප්‍රදාය විසින් සුරක්ෂිත කරන ලද විශිෂ්ට ඥාන සම්භාරය නොනසා ආරක්ෂා කිරීම
13. ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් පාලි භාෂාව භාවිත කිරීම සඳහා සිසුන් යොමු කිරීම
14. පාලි භාෂාව ඉගෙනීමෙන් බෞද්ධ දර්ශනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම පහසු වීම නිසා තමන්ටත් සිව්පසය සපයන දායක පිරිසටත් මෙලොව පරලොව සුභසිද්ධිය ළඟා කර ගත හැකි බව තහවුරු කිරීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2407 | 28 | 2435 |
| ඉංග්‍රීසි | 18 | 00 | 18 |
| එකතුව | 2425 | 28 | 2453 |

වගුව 1.1

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 236 | 9.73 | 1 | 3.57 | 237 | 9.66 |
| B | 283 | 11.67 | 0 | 0 | 283 | 11.54 |
| C | 650 | 26.80 | 6 | 21.43 | 656 | 26.74 |
| S | 857 | 35.34 | 13 | 46.43 | 870 | 35.47 |
| W | 399 | 16.45 | 8 | 28.57 | 407 | 16.59 |
| **එකතුව** | **2425** | **100.00** | **28** | **100.00** | **2453** | **100.00** |

වගුව 1.2

### 1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 149 | 32 | 21.48 | 28 | 18.79 | 40 | 26.85 | 39 | 26.17 | 139 | 93.29 | 10 | 6.71 |
| ගම්පහ | 207 | 18 | 8.70 | 25 | 12.08 | 50 | 24.15 | 77 | 37.20 | 170 | 82.13 | 37 | 17.87 |
| කළුතර | 162 | 24 | 14.81 | 27 | 16.67 | 57 | 35.19 | 46 | 28.40 | 154 | 95.06 | 8 | 4.94 |
| මහනුවර | 296 | 64 | 21.62 | 48 | 16.22 | 83 | 28.04 | 79 | 26.69 | 274 | 92.57 | 22 | 7.43 |
| මාතලේ | 81 | 3 | 3.70 | 4 | 4.94 | 22 | 27.16 | 43 | 53.09 | 72 | 88.89 | 9 | 11.11 |
| නුවරඑළිය | 40 | 1 | 2.50 | 3 | 7.50 | 2 | 5.00 | 23 | 57.50 | 29 | 72.50 | 11 | 27.50 |
| ගාල්ල | 200 | 14 | 7.00 | 32 | 16.00 | 50 | 25.00 | 70 | 35.00 | 166 | 83.00 | 34 | 17.00 |
| මාතර | 162 | 12 | 7.41 | 13 | 8.02 | 43 | 26.54 | 64 | 39.51 | 132 | 81.48 | 30 | 18.52 |
| හම්බන්තොට | 127 | 5 | 3.94 | 12 | 9.45 | 31 | 24.41 | 52 | 40.94 | 100 | 78.74 | 27 | 21.26 |
| වව්නියාව | 02 | 0 | 0.00 | 0 | 0.00 | 2 | 100.00 | 0 | 0.00 | 2 | 100.00 | 0 | 0.00 |
| අම්පාර | 73 | 3 | 4.11 | 6 | 8.22 | 14 | 19.18 | 33 | 45.21 | 56 | 76.71 | 17 | 23.29 |
| ත්‍රිකුණාමලය | 22 | 2 | 9.09 | 3 | 13.64 | 7 | 31.82 | 3 | 13.64 | 15 | 68.18 | 7 | 31.82 |
| කුරුණෑගල | 238 | 20 | 8.40 | 25 | 10.50 | 70 | 29.41 | 81 | 34.03 | 196 | 82.35 | 42 | 17.65 |
| පුත්තලම | 58 | 0 | 0.00 | 0 | 0.00 | 7 | 12.07 | 23 | 39.66 | 30 | 51.72 | 28 | 48.28 |
| අනුරාධපුරය | 165 | 10 | 6.06 | 3 | 1.82 | 52 | 31.52 | 63 | 38.18 | 128 | 77.58 | 37 | 22.42 |
| පොළොන්නරුව | 53 | 0 | 0.00 | 1 | 1.89 | 9 | 16.98 | 20 | 37.74 | 30 | 56.60 | 23 | 43.40 |
| බදුල්ල | 116 | 11 | 9.48 | 15 | 12.93 | 26 | 22.41 | 45 | 38.79 | 97 | 83.62 | 19 | 16.38 |
| මොනරාගල | 84 | 3 | 3.57 | 10 | 11.90 | 26 | 30.95 | 35 | 41.67 | 74 | 88.10 | 10 | 11.90 |
| රත්නපුරය | 119 | 8 | 6.72 | 16 | 13.45 | 32 | 26.89 | 40 | 33.61 | 96 | 80.67 | 23 | 19.33 |
| කෑගල්ල | 99 | 7 | 7.07 | 12 | 12.12 | 33 | 33.33 | 34 | 34.34 | 86 | 86.87 | 13 | 13.13 |
| **සමස්ත දිවයින** | **2453** | **237** | **9.66** | **283** | **11.54** | **656** | **26.74** | **870** | **35.47** | **2046** | **83.41** | **407** | **16.59** |

වගුව 1.3

## 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 04 | 0.16 | 2453 | 100.00 |
| 81 - 90 | 49 | 2.00 | 2449 | 99.84 |
| 71 - 80 | 163 | 6.64 | 2400 | 97.84 |
| 61 - 70 | 268 | 10.93 | 2237 | 91.19 |
| 51 - 60 | 418 | 17.04 | 1969 | 80.27 |
| 41 - 50 | 467 | 19.04 | 1551 | 63.23 |
| 31 - 40 | 476 | 19.40 | 1084 | 44.19 |
| 21 - 30 | 379 | 15.45 | 608 | 24.79 |
| 11 - 20 | 209 | 8.52 | 229 | 9.34 |
| 01 - 10 | 20 | 0.82 | 20 | 0.82 |
| 00 - 00 | 00 | 0.00 | 00 | 0.00 |

**වගුව 1.4**

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- 31 - 40 පන්ති ප්‍රාන්තරය සැලකීමේදී,
මෙම විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2453 දෙනා අතුරෙන් 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 476කි. එය ප්‍රතිශතයක් වශයෙන් 19.40%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 1084ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 44.19%කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

කාලය : පැය 01 යි.

වරණ 4 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40කි. එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ 4 අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තේරීම අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

එක් එක් ප්‍රශ්නයට ලකුණු 1 බැගින් මුළු ලකුණු 40 කි.

## 2.2 I ප්‍රශ්න පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**Note :**

* Answer **all** questions. This paper carries **40** marks.
* In each of the questions from **1** to **40**, select one of the alternatives (1), (2), (3), (4) which is **correct or most appropriate.**
* **Mark a cross (x) on the number corresponding to your choice in the answer sheet provided.**
* Read the instructions given on the back of the answer sheet and follow them also.

1. පාලි භාෂාවේ අඝෝෂාක්ෂර සංඛ්‍යාව,
   The number of non-aspirates in Pali are
   (1) එකොළහකි. eleven. (2) දහයකි. ten. (3) විස්සකි. twenty. (4) පහළොවකි. fifteen.

2. අකාරාදි පිළිවෙළ ගළපා ඇති වරණය තෝරන්න.
   Select the option in which the words have been arranged alphabetically.
   (1) අප්පමත්තො, අගමංසු, පාතරාසං, දෙවදත්තො
   appamatto, agamaṃsu, pātarāsaṃ, Devadatto
   (2) අගමංසු, අප්පමත්තො, පාතරාසං, දෙවදත්තො
   agamaṃsu, appamatto, pātarāsaṃ, Devadatto
   (3) අප්පමත්තො, අගමංසු, දෙවදත්තො, පාතරාසං
   appamatto, agamaṃsu, Devadatto, pātarāsaṃ
   (4) අගමංසු, අප්පමත්තො, දෙවදත්තො, පාතරාසං
   agamaṃsu, appamatto, Devadatto, pātarāsaṃ

3. මූර්ධජාක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   Select the option that contains only Linguals.
   (1) ට , ඨ , ණ , බ
   ṭa, ṭha, ṇa, ba
   (2) ඩ , ණ , ර , ට
   ḍa, ṇa, ra, ṭa
   (3) ඪ , න , ස , ල
   ḍha, na, sa, la
   (4) උ , ප , ස , ග
   u, pa, sa, ga

4. 26 හා 56 යන සංඛ්‍යා නිවැරදි ව පාලියෙන් ප්‍රකාශ කෙරෙන සංඛ්‍යා නාම ඇතුළත් වරණය තෝරන්න
   Select the option that contains correct Pali words for numerals 25 and 56.
   (1) ඡත්තිංසති, පඤ්චපඤ්ඤාසති
   chattiṃsati, pañcapaññāsati
   (2) ඡපඤ්ඤාසති, පඤ්චවීසති
   chapaññāsati, pañcavīsati
   (3) ඡබ්බීසති, පඤ්චපඤ්ඤාසති
   chabbīsati, pañcapaññāsati
   (4) ඡබ්බීසති, ඡපඤ්ඤාසති
   chabbīsati, chapaññāsati

5. 'කම්මත්ථෙ දුතියා' යන බාලාවතාර සූත්‍රයට නිදසුන් කළ හැකි පාලි වාක්‍ය තෝරන්න.
Select the Pali sentence that stands example for the Balavatara sutra 'kammatthe dutiyā'.

(1) කුමාරො භත්තං භුඤ්ජති
Kumāro bhattaṃ buñjati
(2) මනුස්සා චොරා භායන්ති
Manussā corā bhāyanti
(3) රාජා ආසනෙ නිසීදති
Rājā āsane nisīdati
(4) බුද්ධෙන ධම්මො දෙසිතො
Buddhena dhammo desito

6. සාමණේර යනු
'Sāmaṇera' is a

(1) කිතකයකි.
primary derivative (kitaka).
(2) සන්ධියකි.
combination (sandhi).
(3) සමාසයකි.
compound (samāsa).
(4) තද්ධිතයකි.
secondary derivative (taddhita).

7. කම්මධාරය සමාස පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
Select the option that contains only *Kammadhāraya* compounds.

(1) මහාවීරො, මුනිසීහො, අසුරො
mahāvīro, munisīho, asuro
(2) නාගමානවිකා, තිලොකං, ජිනචරිතං
nāgamānavikā, tilokaṃ, jinacaritaṃ
(3) මාතාපිතරො, ගුණධනං, තිභවා
mātāpitaro, guṇadhanaṃ, tibhavā
(4) මහාසද්ධා, බුද්ධනාගො, වනවාසො
mahāsaddhā, Buddhanāgo, vanavāso

8. දෙවදත්තො යන්නෙහි නිවැරදි විග්‍රහ වාක්‍යය වන්නේ
The correct etymological interpretation of the term 'Devadatta' is.

(1) දෙවෙ දත්තො යන්න යි.
deve datto.
(2) දෙවෙන දත්තො යන්න යි.
devena datto.
(3) දෙවස්ස දත්තො යන්න යි.
devassa datto.
(4) දෙවං දත්තො යන්න යි.
devaṃ datto.

9. 'විභජ්ජ' යනු
'Vibhajja' is a

(1) සන්ධියකි.
combination (sandhi).
(2) නිපාතයකි.
indeclinable particle (nipāta).
(3) තද්ධිතයකි.
secondary derivative (taddhita).
(4) පූර්වක්‍රියාවකි.
gerund (pūrvakriyā)

10. නිර්ධාරණාර්ථයෙහි යෙදෙන විභක්ති ඇතුළත් වරණය තෝරන්න.
Select the option that contains the Cases employed in Nirdhāraṇārtha.

(1) ඡට්ඨී සහ චතුත්ථී
Chaṭṭhi (Genitive) and Catutthi (Dative)
(2) ඡට්ඨී සහ සත්තමී
Chaṭṭhi (Genitive) and Sattamī (Locative)
(3) සත්තමී සහ චතුත්ථී
Sattamī (Locative) and Catutthi (Dative)
(4) තතියා සහ චතුත්ථී
Tatiya (Instrumental) and Catutthi (Dative)

11. පාලි භාෂාවේ සමාස ගණන
The number of Compounds in Pali are

(1) හතරකි.
four.
(2) පහකි,
five.
(3) හයකි.
six.
(4) හතකි.
seven.

12. 'අව්‍යය පද' යනු

'Avyaya pada' means

(1) නාමයකට ප්‍රත්‍යයක් එකතු වී සෑදෙන පද ය.
the words formed combining nouns and suffixes.

(2) ධාතුවකට ප්‍රත්‍යයක් එකතු වී සෑදෙන පද ය.
the words formed adding a suffix to a root.

(3) නො වරනැගෙන පද ය.
indeclinable words.

(4) නාමපද දෙකක් එකතු වී සෑදෙන පද ය.
the words formed joining two nouns.

13. ද්විකර්මක ධාතු යුගලය ඇතුළත් වරණය තෝරන්න.

Select the option that contains the pair of *dvikarmaka* roots.

(1) දුහ, ගමු
duha, gamu

(2) යාච, ඨා
yāca, ṭhā

(3) පච, රුධි
paca, rudhi

(4) යාච, පුච්ඡ
yāca, puccha

14. 'පූවගන්ධො' යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ

The correct meaning of the phrase 'pūvagandho' is

(1) පුස් ගඳ යන්න යි.
smell of musty.

(2) පුස් සුවඳ යන්න යි.
aroma of musty.

(3) කැවුම් සුවඳ යන්න යි.
aroma of oil cake.

(4) පුවක් සුවඳ යන්න යි.
aroma of areca-nut.

15. අර්ථයෙන් සමාන නොවන නිපාත යුගලය තෝරන්න.

Select the dissimilar pair of indeclinable words.

(1) දුවං - නූන
duvaṃ - nūna

(2) මුධා - මුසා
mudhā - musā

(3) සහ - සද්ධිං
saha - saddhiṃ

(4) මුසා - මිච්ඡා
musā - micchā

16. 'මයි ගාමං ගතෙ එකො මිත්තො සම්මුඛී භවි' යන්නෙහි විභක්ති ප්‍රයෝගය වන්නේ

The type of case employment in the sentence 'mayi gāmaṃ gate eko mitto sammukhī bhavi' is

(1) කාලාර්ථයෙහි සත්තමී විභක්තිය යි.
kālārthaye sattamī.

(2) නිර්ධාරණාර්ථයෙහි සත්තමී විභක්තිය යි.
nirdhāraṇārthaye sattamī.

(3) භාවාර්ථයෙහි සත්තමී විභක්තිය යි.
bhāvārthaye sattamī.

(4) කාලාර්ථයෙහි සහ භාවාර්ථයෙහි සත්තමී විභක්තිය යි.
kālārthaye and bhāvārthaye sattamī.

17. පාලි භාෂාවේ අතීත ආඛ්‍යාත විභක්ති ගණන

The number of Moods that denote past time in Pali is

(1) දෙකකි.
two.

(2) තුනකි.
three.

(3) හතරකි.
four.

(4) පහකි.
five.

18. "මමෙව කතමඤ්ඤන්තු ගිහී පබ්බජිතා උභො" යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ
The correct meaning of the line "mameva katamaññantu - gihī pabbajitā ubho" is
(1) මා විසින් ම කරන ලදැයි ගිහි පැවිදි දෙපාර්ශ්වය ම දැන ගනිත්වා යන්න යි.
May both lay and clergy parties know that it is done by me.
(2) මා විසින් ම අනෙකක් කරන ලදැයි ගිහි පැවිදි දෙපාර්ශ්වය ම දැන ගනිත්වා යන්න යි.
May both lay and clergy parties know that else is done by me.
(3) පැවිදි වූ මා විසින් ම කරන ලදැයි ගිහි පැවිදි දෙපාර්ශ්වය ම දැන ගනිත්වා යන්න යි.
May both lay and clergy parties know that it is done by ordained me.
(4) ගිහි වූ මා විසින් ම කරන ලදැයි ගිහි පැවිදි දෙපාර්ශ්වය ම දැන ගනිත්වා යන්න යි.
May both lay and clergy parties know that it is done by me being a lay person.

19. 'මව කෑ යුතු පූත භෝජන ගෙනාවා ය.' යන අර්ථය දෙන පාලි වාක්‍යය තෝරන්න.
Select the Pali sentence that carries the meaning 'Mother brought the eatable *pūta* meal.'
(1) මාතා ඛාදනීයං භෝජනං ආනෙසි
Mātā khādaniyaṃ bhojanaṃ ānesi
(2) මාතා ඛාදනීයං පූතං භෝජනං ආනෙසිං
Mātā khādaniyaṃ pūtaṃ bhojanaṃ ānesiṃ
(3) මාතා ඛාදනීයානි පූතං භෝජනං ආනෙසි
Mātā khādanīyāni pūtaṃ bhojanaṃ ānesi
(4) මාතා ඛාදනීයං පූතං භෝජනං ආනෙසි
Mātā khādanīyaṃ pūtaṃ bhojanaṃ ānesi

20. පාලියෙහි සුඞ්ක යනු
In Pali, 'Suṅka' means
(1) නගුල යි. plough.
(2) මොල්ලිය යි. hump.
(3) අයබදු යි. tax.
(4) ඔටුන්න යි. crown.

21. 'බුද්ධො ධම්මං දෙසෙති' යන්නෙහි කර්ම කාරක වාක්‍ය වන්නේ
The passive form of the sentence 'Buddho dhammaṃ deseti' is
(1) බුද්ධෙන ධම්මං දෙසීයතෙ ය.
Buddhena dhammaṃ desīyate.
(2) බුද්ධො ධම්මං දෙසීයතෙ ය.
Buddho dhammaṃ desīyate.
(3) බුද්ධෙන ධම්මං දෙසිතො ය.
Buddhena dhammaṃ desito.
(4) බුද්ධෙන ධම්මො දෙසීයතෙ ය.
Buddhena dhammo desīyate.

22. 'පච්චත්තං' යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ
The correctly disjoined form of the term 'paccattaṃ' is
(1) පච්ච + අත්තං ය.
pacca + attaṃ.
(2) පච්ච + ත්තං ය.
pacca + ttaṃ.
(3) පති + ච + ත්තං ය.
pati + ca + ttaṃ.
(4) පති + අත්තං ය.
pati + attaṃ.

23. නිග්ගහීත සන්ධියට අදාළ සූත්‍රයක් වන්නේ
A sutra that belongs to the category of Niggahīta Sandhi is
(1) පරො වා සරො යන්න යි.
paro vā saro.
(2) සරෙ ක්වචි යන්න යි.
sare kvaci.
(3) ක්වචි ඔ බ්‍යඤ්ජනෙ යන්න යි.
kvaci o byañjane.
(4) වා පරො අසරූපා යන්න යි.
vā paro asarūpā.

24. **'අපචිත්ථ' යන ක්‍රියා පදය අයත් වන ආඛ්‍යාත විභක්තිය කුමක් ද?**
**What is the Mode of verb to which the verb 'apacittha' belongs to?**
**(1) හීයත්තනී**
**Hīyattanī**
**(2) අජ්ජතනී**
**Ajjatanī**
**(3) සත්තමී**
**Sattamī**
**(4) කාලාතිපත්ති**
**Kālātipatti**

25. කාලාර්ථයක් ප්‍රකාශ වන නිපාත පදය කුමක් ද?
What is the indeclinable particle (nipāta) that denotes a time?.

(1) සුවෙ suve (2) ආවි āvi (3) ඉතො ito (4) වත vata

26. විරුද්ධාර්ථ නො වන පද යුගලය වන්නේ
The pair of words that is **not** antonym is

(1) අණු - ථූල ය. aṇu - thūla.
(2) ථූල - කිස ය. thūla - kisa.
(3) සලිල - වාරි ය. salila - vāri
(4) බාල - පණ්ඩිත ය. bāla - paṇḍitha

27. "සංඝමිත්තාථෙරී දක්ඛිණබොධිසාඛං ගහෙත්වා ................................ පුණ්ණරසියං ලංකාදීපමුපාගමි" යන වැකියෙහි හිස්තැනට උචිත පදය තෝරන්න.
Select the suitable word for the blank in the sentence "Sanghamittā therī dakkhiṇabodhisākaṃ gahetvā ................................ puṇṇarasiyaṃ Lankādīpamupāgami."

(1) වෙසාඛෙ Vesākhe (2) ආසාළ්හෙ Āsāḷhe (3) මාගසිරෙ Māgasire (4) ජෙට්ඨෙ Jeṭṭhe

28. සත්තමී ආඛ්‍යාත පද පමණක් ඇති වරණය තෝරන්න.
Select the option which includes only Optative Mood verbs.

(1) ආනෙය්‍යං, කථෙස්සාමි, පපචිරෙ āneyyaṃ, kathessāmi, papacire
(2) යාති, ගමිස්සාමි, පටිජග්ගෙය්‍ය yāti, gamissāmi, paṭijaggeyya
(3) වස්සතු, භවන්තු, භුඤ්ජෙය්‍යුං vassatu, bhavantu, bhuñjeyyuṃ
(4) භජෙ, කරෙය්‍ය, පුච්ඡෙය්‍ය bhaje, kareyya, puccheyya

29. 'සන්තිකෙ' හා 'අවිදූරෙ' යන නිපාත පද යොදනු ලබන්නේ
The indeclinable particles 'santike' and 'avidūre' can be emplyed with the case words.

(1) චතුත්ථී විභක්තිය සමග ය. catutthī (Dative).
(2) ඡට්ඨී විභක්තිය සමග ය. chaṭṭhī (Genitive).
(3) පඤ්චමී විභක්තිය සමග ය. pañcamī (Ablative).
(4) දුතියා විභක්තිය සමග ය. dutiyā (Accusative).

30. පොළොන්නරු යුගයේ විසූ වාචිස්සර හිමියන් විසින් රචනා කරන ලද කෘතියක් වන්නේ
The work composed by venerable Vācissara of Polonnaruwa period is

(1) දාඨාවංසය යි. the Dāṭhāvaṃsa.
(2) ලලාටධාතුවංසය යි. the Lalāṭadhātuvaṃsa.
(3) අනාගතවංසය යි. the Anāgatavaṃsa.
(4) ථූපවංසය යි. the Thūpavaṃsa.

31. භාව තද්ධිතයට අයත් පදයක් වන්නේ
A word that represents *bhāva taddhita* is

(1) මානව යන්න යි. mānava.
(2) සාකටික යන්න යි. sākaṭika.
(3) ලහුතා යන්න යි. lahutā.
(4) ගුණවන්තු යන්න යි. guṇavantu.

32. "ඉච්ඡිතං පත්ථිතං තුය්හං - ඛිප්පමෙව සමිජ්ඣතු" මෙහි ඇත්තේ
The lines of the stanza "icchitaṃ patthitaṃ tuyhaṃ - khippameva samijjhatu" contain the words

(1) වර්තමාන කාලික කිතක පද ය. of present tense primary derivatives.
(2) අතීත කාලික කිතක පද ය. of past tense primary derivatives.
(3) උණාදි කිතක පද ය. of uṇādī primary derivatives.
(4) ත්‍රෛකාලික කිතක පද ය. of all time primary derivatives.

33. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් විසින් රචනා නො කරන ලද ග්‍රන්ථයක් වන්නේ
The work that was **not** composed by venerable Polwatte Buddhadatta is

(1) බෞද්ධ භාරතය යි.
the Bauddha Bhārata.

(2) පාලි භාෂාවතරණය යි.
the Pāli Bhāsāvataraṇa.

(3) ථෙරවාදී බෞද්ධාචාර්යයෝ යි.
the Theravadi Bauddhācāryayo.

(4) පාලි සාහිත්‍යය යි.
the Pāli Sāhityaya.

34. ධම්මපදයෙහි අන්තර්ගත වර්ග දෙකක් වන්නේ
Two chapters that included in the Dhammapada are

(1) යමකවග්ග සහ උපාසකවග්ග.
Yamakavagga and Upāsakavagga.

(2) මඞ්ගලවග්ග සහ අප්පමාදවග්ග.
Maṅgalavagga and Appamādavagga.

(3) චිත්තවග්ග සහ පුප්ඵවග්ග.
Cittavagga and Pupphavagga.

(4) පුඤ්ඤවග්ග සහ පාපවග්ග.
Puññavagga and Pāpavagga.

35. සුත්තනිපාතය අයත් වන්නේ
The Suttanipāta belongs to

(1) අඞ්ගුත්තරනිකායට ය.
the Aṅguttaranikāya.

(2) සංයුත්තනිකායට ය.
the Saṃyuttanikāya.

(3) ඛුද්දකනිකායට ය.
the Khuddakanikāya

(4) මහාවග්ගපාළියට ය.
the Mahāvaggapāli

36. බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද අටුවා ග්‍රන්ථ ඇතුළත් වරණය කුමක් ද?
Which is the option that comprises commentaries of venerable Buddhaghosa?

(1) සුමඞ්ගලවිලාසිනී, කඞ්ඛාවිතරණී, පරමත්ථදීපනී
Sumaṅgalavilāsinī, Kaṅkhāvitaraṇī, Paramatthadīpanī

(2) අත්ථසාලිනී, සුමඞ්ගලවිලාසිනී, කඞ්ඛාවිතරණී
Atthasālinī, Sumaṅgalavilāsinī, Kaṅkhāvitaraṇī

(3) අත්ථසාලිනී, පරමත්ථදීපනී, පපඤ්චසූදනී
Atthasālinī, Paramatthadīpanī, Papañcasūdanī

(4) මධුරත්ථප්පකාසිනී, පපඤ්චසූදනී, සම්මොහවිනොදනී
Madhuratthappakāsinī, Papañcasūdanī, Sammohavinodanī

37. උපසර්ග පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
Select the option that contains only upasarga prefixes.

(1) ප, දු, අව, සු
pa, du, ava, su

(2) නි, සං, ආ, කු
ni, saṃ, ā, ku

(3) ච, උ, සු, දු
ca, u, su, du

(4) නී, හා, සං, පරි
nī, hā, saṃ, pari

38. අපදානපාළියේ ඇතුළත් අපදාන ප්‍රධාන වශයෙන් කොටස්
The number of main sections in the Apadānapāli are

(1) තුනකි.
three.

(2) හයකි.
six.

(3) හතරකි.
four.

(4) පහකි.
five.

39. 'තිට්ඨති' යන්නෙහි ධාතුව වන්නේ
The root of the verb 'tiṭṭhati' is

(1) තිට්ඨ යන්න යි.
tiṭṭha.

(2) ඨා යන්න යි.
ṭhā.

(3) ට්ඨ යන්න යි.
ṭṭha.

(4) ඨ යන්න යි.
ṭha.

40. රිස් ඩේවිඩ්ස් පඬිතුමා විසින් පළමුවෙන් රචනා කරන ලද කෘතිය ලෙස සැලකෙන්නේ
The first work of the scholar Rhys Davids is

(1) බුද්ධධර්ම සංග්‍රහ ග්‍රන්ථය යි.
Buddhadharma Sangraha.

(2) ලංකාවේ පැරණි කාසි හා මැනීම් ක්‍රම ග්‍රන්ථය යි.
Lankave Peraṇi Kāsi hā Menīm Krama.

(3) බෞද්ධ ජාතක කථා ග්‍රන්ථය යි.
Bauddha Jātakakathā.

(4) බෞද්ධ සූත්‍ර ග්‍රන්ථය යි.
Bauddha Sūtra.


## 2.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | ...1.... | 21. | ...4.... |
| 02. | ..4.... | 22. | ...4.... |
| 03. | ...2.... | 23. | ...1.... |
| 04. | ...4.... | 24. | ...2.... |
| 05. | ...1.... | 25. | ...1.... |
| 06. | ...4.... | 26. | ...3.... |
| 07. | ...1.... | 27. | ...3.... |
| 08. | ..2... | 28. | ...4.... |
| 09. | ...4.... | 29. | ...2.... |
| 10. | ...2.... | 30. | ...4.... |
| 11. | ...3.... | 31. | ...3... |
| 12. | ...3.... | 32. | ...2.... |
| 13. | ...4.... | 33. | ...1.... |
| 14. | ...3.... | 34. | ...3.... |
| 15. | ...2.... | 35. | ...3.... |
| 16. | ...1.... | 36. | ...2.... |
| 17. | ..2, 3.. | 37. | ...1.... |
| 18. | ...1.... | 38. | ...3.... |
| 19. | ...4.... | 39. | ...2.... |
| 20. | ...3.... | 40. | ...2.... |

වගුව 2.1

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.**

## 2.4. I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය




ප්‍රස්තාරය 2.1 (**RD/16/05/MPF** පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර සපයා ඇති 34 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.89කි. එනම් 34 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 89%ක් නිවැරදි පිළිතුරු සපයා ඇත. ඒ අනුව ප්‍රශ්නයේ පහසුතාව 89%කි.

## 2.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිවුවන වරණය | Missing |
| 1 | 1 | 84.5 | 9.1 | 4.95 | 1.35 | 0.09 |
| 2 | 4 | 4.86 | 14.23 | 12.34 | 68.56 | 0 |
| 3 | 2 | 20.36 | 62.52 | 13.06 | 3.78 | 0.27 |
| 4 | 4 | 13.46 | 14.54 | 13.82 | 57.99 | 0.09 |
| 5 | 1 | 53.78 | 11.26 | 12.97 | 21.98 | 0 |
| 6 | 4 | 16.85 | 10.99 | 18.92 | 53.24 | 0 |
| 7 | 1 | 48.92 | 13.24 | 9.19 | 28.38 | 0.27 |
| 8 | 2 | 20.63 | 33.06 | 24.14 | 22.16 | 0 |
| 9 | 4 | 29.46 | 27.84 | 21.53 | 21.17 | 0 |
| 10 | 2 | 26.49 | 31.26 | 25.86 | 16.13 | 0.27 |
| 11 | 3 | 6.85 | 12.52 | 78.02 | 2.34 | 0.27 |
| 12 | 3 | 12.25 | 14.68 | 65.41 | 7.39 | 0.27 |
| 13 | 4 | 17.57 | 11.89 | 27.66 | 42.79 | 0.09 |
| 14 | 3 | 22.52 | 10.72 | 51.08 | 15.32 | 0.36 |
| 15 | 2 | 31.89 | 48.65 | 7.84 | 11.44 | 0.18 |
| 16 | 1 | 30.09 | 23.33 | 19.19 | 27.12 | 0.27 |
| 17 | 2, 3 | 17.93 | 38.29 | 33.42 | 10.36 | 0 |
| 18 | 1 | 60.45 | 22.34 | 10.81 | 6.4 | 0 |
| 19 | 4 | 8.02 | 18.02 | 33.06 | 40.54 | 0.36 |
| 20 | 3 | 44.14 | 27.21 | 17.48 | 11.17 | 0 |
| 21 | 4 | 25.86 | 12.52 | 23.69 | 37.66 | 0.27 |
| 22 | 4 | 34.05 | 7.03 | 7.12 | 51.8 | 0 |
| 23 | 1 | 25.68 | 33.33 | 19.28 | 21.62 | 0.09 |
| 24 | 2 | 22.61 | 55.68 | 11.35 | 10.09 | 0.27 |
| 25 | 1 | 64.14 | 10.54 | 18.74 | 6.4 | 0.18 |
| 26 | 3 | 21.08 | 36.58 | 30.54 | 11.53 | 0.27 |
| 27 | 3 | 12.79 | 27.75 | 42.88 | 16.31 | 0.27 |
| 28 | 4 | 10.99 | 12.07 | 24.86 | 51.98 | 0.09 |
| 29 | 2 | 26.13 | 28.38 | 23.33 | 21.89 | 0.27 |
| 30 | 4 | 26.58 | 31.35 | 25.32 | 16.4 | 0.36 |
| 31 | 3 | 19.28 | 24.41 | 28.02 | 27.75 | 0.54 |
| 32 | 2 | 23.51 | 24.14 | 7.84 | 44.05 | 0.45 |
| 33 | 1 | 48.11 | 10.09 | 29.01 | 12.43 | 0.36 |
| 34 | 3 | 3.69 | 3.69 | 89.46 | 2.97 | 0.18 |
| 35 | 3 | 20.45 | 15.95 | 54.23 | 9.01 | 0.36 |
| 36 | 2 | 29.19 | 47.39 | 17.21 | 5.86 | 0.36 |
| 37 | 1 | 67.21 | 13.51 | 9.46 | 9.55 | 0.27 |
| 38 | 3 | 13.87 | 11.98 | 67.12 | 6.76 | 0.27 |
| 39 | 2 | 62.43 | 17.3 | 9.1 | 10.81 | 0.36 |
| 40 | 2 | 16.58 | 64.95 | 10.54 | 7.66 | 0.27 |

වගුව 2.2

**එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.**
**'Missing' තීරයේ දක්වා ඇත්තේ කිසිඳු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරා ගත් හෝ අපේක්ෂකයන් ප්‍රතිශතයයි.**

## 2.6 තේමා අනුව I ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේදී පදනම් කරගත් තේමා තුනකි. ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය මෙසේය.

| තේමාව | ප්‍රශ්න අංකය |
|---|---|
| ව්‍යාකරණ | 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 15, 16, 17, 21, 22, 23, 24, 25, 26, 28, 29, 31, 32, 37, 39 |
| සාහිත්‍යය | 14, 18, 20, 27, 30, 33, 34, 35, 36, 38, 40 |
| පරිවර්තන | 19 |


වගුව 2.3

ව්‍යාකරණ තේමාව යටතේ ඉදිරිපත් කර තිබූ ප්‍රශ්න 28 තවදුරටත් පහත ආකාරයට අනු තේමා අනුව විශ්ලේෂණය කර දැක්විය හැකිය.

| තේමාව | අනු තේමාව | ප්‍රශ්න අංකය |
|---|---|---|
| ව්‍යාකරණ | අක්ෂර | 1, 2, 3 |
| | ආඛ්‍යාත | 9, 13, 17, 28, 39 |
| | සංඛ්‍යා | 4 |
| | විභක්ති | 5, 21, 24 |
| | තද්ධිත | 6, 31 |
| | සමාස | 7, 8, 11 |
| | කාරක | 10, 16 |
| | නිපාත | 12, 15, 29, 25 |
| | සන්ධි | 22, 23 |
| | නාම | 26 |
| | උපසර්ග | 37 |
| | කිතක | 32 |

වගුව 2.4

## මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020
## 02 - පාලි - I පත්‍රය
## තේමා අනුව එක් එක් අයිතමයෙහි පහසුතා දර්ශකය




ප්‍රස්තාරය 1 (**RD/16/05/MPF** පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)


සාහිත්‍ය තේමාව යටතේ ඇති ප්‍රශ්න 11 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ 34 ප්‍රශ්නයයි. එය සමස්ත I පත්‍රයේම පහසුම ප්‍රශ්නය ද වේ. එහි පහසුතාව 89%කි. I පත්‍රයේ පහසුතාව අඩුම ප්‍රශ්නය සාහිත්‍ය තේමාව යටතේම ඇති 30 ප්‍රශ්නයයි. එහි පහසුතාව 16%කි. ඉහත සාහිත්‍ය තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් 50%ක් හෝ ඊට වැඩි පහසුතාවක් ඇති ප්‍රශ්න 6කි. ඒවා නම් 14, 18, 34, 35, 38 හා 40 යන ප්‍රශ්නයි. 20% වඩා අඩු පහසුතාවක් ඇති ප්‍රශ්න 02කි. ඒවා නම් 20 හා 30 යන ප්‍රශ්න වේ.

ව්‍යාකරණ තේමාව යටතේ ඇති ප්‍රශ්න 28 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ පළමු ප්‍රශ්නයයි. එහි පහසුතාව 85%කි. පහසුතාව අඩුම ප්‍රශ්නය වන්නේ 39 ප්‍රශ්නයයි. එහි පහසුතාව 17% කි. ව්‍යාකරණ ප්‍රශ්න 28න් පහසුතාව 50%ට වැඩි ප්‍රශ්න 13කි. ඒවා නම් 1, 2, 3, 4, 5, 6, 11, 12, 22, 24, 25, 28 හා 37 යන ප්‍රශ්නයි. පරිවර්තන තේමාව යටතේ ප්‍රශ්න 1ක් පමණක් ඉදිරිපත් කර ඇත. 19 ප්‍රශ්නය වන එහි පහසුතාව 41%කි.

| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව |
|---|---|---|
| ව්‍යාකරණ | 01 (85%) | 39 (17%) |
| සාහිත්‍යය | 34 (89%) | 30 (16%) |
| පරිවර්තන | * | * |

වගුව 2.4

* පරිවර්තන තේමාව යටතේ එක් ප්‍රශ්නයක් පමණක් ඉදිරිපත් ව ඇති බැවින් පහසුතාව වැඩිම හා අඩුම ලෙස ප්‍රශ්න වර්ගීකරණයක් සිදු කළ නොහැකිය. පරිවර්තන තේමාව යටතේ ඉදිරිපත් කර ඇති 19වන ප්‍රශ්නයේ පහසුතාව 41%කි.




**ප්‍රස්තාරය 2.3**

I පත්‍රයේ සමස්ත පහසුතාව 52.4%කි.

පාලි I පත්‍රය සැකසීමේදී පදනම් කරගත් තේමා තුන අතුරෙන් එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතාව සලකා එක් එක් තේමාවෙහි මධ්‍යක පහසුතාව හා එම තේමාව යටතේ ඉදිරිපත් වී තිබූ ප්‍රශ්න ප්‍රමාණය මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත. පරිවර්තන තේමාව යටතේ අවම ප්‍රශ්න ප්‍රතිශතයක් ඉදිරිපත් වී තිබූ අතර එම තේමාවේ පහසුතාව 41%කි. මෙම තේමා තුන අතුරෙන් පහසුතාව වැඩිම සාහිත්‍ය තේමාව වේ. සාහිත්‍ය තේමාව යටතේ සමස්ත I පත්‍රයේ ප්‍රශ්නවලින් 27.5%ක් ඉදිරිපත්ව තිබූ අතර එම තේමාවෙහි මධ්‍යක පහසුතාව 50.64%කි. ව්‍යාකරණ තේමාව යටතේ ඉදිරිපත් වී ඇති ප්‍රශ්න ප්‍රතිශතය 70%කි. එහි මධ්‍යක පහසුතාව 46.27%කි.

## 2.7 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

2020 වර්ෂයේ පාලි විෂයය I පත්‍රය සැකසීමේදී තේමා තුන යටතේම ප්‍රශ්න නිර්මාණය කර ඇති අතර, ව්‍යාකරණ තේමාව යටතේ ප්‍රශ්න 28ක් ද සාහිත්‍ය තේමාව යටතේ ප්‍රශ්න 11ක් ද පරිවර්තන තේමාව යටතේ එක් ප්‍රශ්නයක් ද ඉදිරිපත් කර ඇත.

මෙහි පහසුතාව වැඩිම ප්‍රශ්නය 34 ප්‍රශ්නයයි. එහි පහසුතාව 89%කි. මෙම ප්‍රශ්නය ධම්ම පදය සම්බන්ධයෙන් ඉදිරිපත් වී තිබූ අතර, පළමු ශ්‍රේණියේ සිටම පරිශීලනය කරන බැවින් අපේක්ෂකයන්ගේ සාධනය වැඩි වීමට එය හේතුවක් වී ඇති බව උපකල්පනය කළ හැකිය.

01 ප්‍රශ්නයේ පහසුතාව 85%කි. එම ප්‍රශ්නය අක්ෂර මාලාව සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති අතර, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය ඉහළ මට්ටමක තිබීමට පළමු ශ්‍රේණියේ සිට අක්ෂර මාලාව පිළිබඳ ඇති දැනුම හේතු වී තිබිය හැකිය.

මෙම I කොටසේ පහසුතාව අඩුම ප්‍රශ්නය 30 ප්‍රශ්නයයි. එහි පහසුතාවය 16%කි. මෙම ප්‍රශ්නය සාහිත්‍ය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති අතර, ශිෂ්‍ය සාධනය අවම මට්ටමක පැවතීමට හේතු ලෙස පාලි සාහිත්‍ය ග්‍රන්ථ කතෘවරුන් සම්බන්ධයෙන් ඇති දැනුම ප්‍රමාණවත් නොවීම දැක්විය හැකිය. එම නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී පාලි සාහිත්‍ය කතෘවරුන් සම්බන්ධයෙන් ද සිසුන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු කිරීම අවශ්‍ය වේ.

20 ප්‍රශ්නය සහ 39 ප්‍රශ්නය සඳහා පහසුතාව 17%කි. මෙහිදී 20 ප්‍රශ්නය සාහිත්‍ය සම්බන්ධයෙන් ඉදිරිපත් වී තිබූ අතර 39 ප්‍රශ්නය ව්‍යාකරණ තේමාව යටතේ ආඛ්‍යාත අනු තේමාවෙන් ඉදිරිපත් කර තිබුණි.

20 ප්‍රශ්නය "සුඬික" යන පාලි වචනයෙහි වචනාර්ථය අසා ඇති අතර එම වචනය නිරන්තරයෙන් භාවිත නොවන බැවින් සිසුන්ට ඒ සඳහා නිවැරදි පිළිතුර ලබාදීමට නොහැකි වී ඇත. 20 ප්‍රශ්නයේ නිවැරදි වරණය 3 වරණය වන අතර එම වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 17.48%කි. නමුත් මෙහිදී නිවැරදි වරණය ලෙස පළමු වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 44.14%කි. මෙවැනි පාලි වචන නිරන්තර භාවිත නොවීම හේතුවෙන් සිසුන්ට එම වචනය නුහුරු වීම නිවැරදි වරණය තේරීමේදී යම් බලපෑමක් කර ඇති බව සිතිය හැකිය. එම නිසා පාලි වචන පිළිබඳ ව සිසුන්ගේ අවධානය වැඩි ලෙස යොමු කිරීම අවශ්‍ය වන අතර ප්‍රායෝගික භාවිතය තුළින් අවශ්‍ය නිපුණතාව ලබාදීමට කටයුතු කළ යුතු ය.

39 ප්‍රශ්නයෙහි ආඛ්‍යාත පදවල ධාතු හා ප්‍රත්‍ය වෙන්කර ගැනීමට දක්වා ඇති දුර්වලතාවය හේතුවෙන් එහි සාධනය අවම වී ඇත. තවද 39 ප්‍රශ්නය සැලකූ විට එහි නිවැරදි වරණය වූ දෙවන වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 17.3%කි. මෙහිදී නිවැරදි වරණය ලෙස පළමු වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 62.43%කි. එහිදී "තිට්ඨත" යන ආඛ්‍යාත පදයෙහි ධාතුව විමසා ඇති අතර වැඩිම අපේක්ෂක පිරිසක් එය 'තිට්ඨ' ලෙස තෝරා ඇත්තේ මෙවැනි ආඛ්‍යාත පදවල ධාතු හා ප්‍රත්‍ය පිළිබඳ ව නිවැරදි අවබෝධයක් නොමැති වීමෙන් බව අවබෝධ වේ. එම නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී මෙවැනි සුවිශේෂී ආඛ්‍යාත පදවල ධාතු හා ප්‍රත්‍ය වෙන්කර ගැනීම සම්බන්ධයෙන් පෙරහුරු අභ්‍යාසවල නියැලීමට සිසුන්ට අවකාශය ලබාදිය යුතු ය.

ඉහත සලකා බලන ලද නිදසුන්වලින් සමස්තයක් ලෙස සාහිත්‍ය තේමාව සඳහා මෙන් ම ව්‍යාකරණ තේමාව යටතේ ඇති ආඛ්‍යාත කොටස් සඳහා ද ගුරු සිසු අවධානය වැඩි වශයෙන් යොමු විය යුතු බව අවධාරණය කළ යුතු ය. උපසර්ගයක් පූර්වයෙන් යෙදෙන ධාතුන් පිළිබඳව ද අවබෝධය ලබාදීමට කටයුතු කිරීම තුළින් ශිෂ්‍යයින්ගේ දැනුම වර්ධනය කිරීමට කටයුතු කළ හැකිය. සතත අභ්‍යාසවල නියැලීම තුළින් ශිෂ්‍ය සාධනය සංවර්ධනය කර ගැනීමට කටයුතු කළ හැකිය. එමෙන් ම පාලි භාෂාවේ විෂය නිර්දේශයේ සමස්තය පිළිබඳ ව මනා අවබෝධය තුළින් එක් එක් විෂය කොටස් සුවිශේෂී ලෙස ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී භාවිත කිරීමට යොමු වීම ද ශිෂ්‍ය සාධනය සඳහා වැදගත් වේ.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

II පත්‍රය - කාලය : පැය 03යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.

I කොටස - අනිවාර්යය ප්‍රශ්න දෙකකින් සමන්විත ය.

1 ප්‍රශ්නය : නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීම

2 ප්‍රශ්නය : (1) කොටස - වාක්‍ය කිහිපයක් පාලි භාෂාවට පරිවර්තනය කිරීම
(II) කොටස - පාලි භාෂා ඡේදයක් ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම

එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ලකුණු 24කි.

II කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න හයකින් සමන්විත ය. ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතු ය.


එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ලකුණු 36කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 24 + 36 = 60

**අවසාන ලකුණු ගණනය කිරීම :**

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 40 |
| II පත්‍රය | = | 60 |
| අවසාන ලකුණ | = | 100 |


## 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




II ප්‍රශ්න පත්‍රයේ පළමු හා දෙවන ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වන අතර එයින් පළමු ප්‍රශ්නය තෝරාගත් ප්‍රතිශතය 89.35%කි. දෙවන ප්‍රශ්නය තෝරාගත් ප්‍රතිශතය 87.1%කි. ප්‍රශ්න අංක 03 සිට 08 දක්වා ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 03ක් පමණක් තෝරාගත යුතු වූ අතර එයින් අපේක්ෂකයන් වැඩි පිරිසක් තෝරාගෙන ඇත්තේ 03, 07 හා 08 වන ප්‍රශ්න වේ. ඒවායේ ප්‍රතිශතයන් පිළිවෙළින් 61.87%, 48.97%, 48.04%ක් වේ. අඩුම අපේක්ෂකයන් සංඛ්‍යාවක් තෝරාගෙන ඇත්තේ පස්වන ප්‍රශ්නයයි. එය ප්‍රතිශතයක් ලෙස 27.48%කි.

ප්‍රස්තාරය 3.1 (RD/16/04/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

## 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :-

මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 12කි.

එම ලකුණුවලින්,


0-3 ප්‍රාන්තරයේ 20.92%ක් ද
4-6 ප්‍රාන්තරයේ 27.62%ක් ද
7-9 ප්‍රාන්තරයේ 25.31%ක් ද
10-12 ප්‍රාන්තරයේ 26.15%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

ප්‍රස්තාරය 3.2

II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ඉදිරි පිටුවල අන්තර්ගත වේ.

## 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය** 3.3 (RD/16/04/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

අපේක්ෂකයන් වැඩිම සංඛ්‍යාවක් සාර්ථක ව පිළිතුරු සපයා ඇති 8(ii) කොටසෙහි පහසුතා දර්ශකය 0.76කි. එනම් 8(ii) කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 76%ක් සාර්ථක ව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම කොටසෙහි පහසුතාව 76%කි. අපේක්ෂකයන්ගෙන් අවම සංඛ්‍යාවක් සාර්ථක ව පිළිතුරු සපයා ඇති 3(iii) (II) අනුකොටස හා 6(ii) කොටසෙහි පහසුතා දර්ශකය 0.09කි. එනම් 3(iii) (III) අනුකොටස හා 6(ii) කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 9%ක් පමණක් සාර්ථක ව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම අනුකොටස් දෙකෙහි පහසුතාව 9%කි.

## 3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය

### I කොටස

**01. ප්‍රශ්නය**

1. (i) **සිංහලට නගන්න.**

තෙන ඛො පන සමයෙන රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දියයති, නො නීහරිතුං. අථ ඛො තස්ස පරිබ්බාජකස්ස එතදහොසි. "රඤ්ඤො ඛො පන පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දියයති, නො නීහරිතුං. යන්නූනා'හං රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා සරං ආගන්ත්වා උග්ගිරිත්වාන දදෙය්‍යං, යං ඉමිස්සා විජාතාය භවිස්සතී" ති. අථ ඛො සො පරිබ්බාජකො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා සරං ආගන්ත්වා නෙව සක්කොති උද්ධං කාතුං, න පන අධො.

**(ලකුණු 06 යි)**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

එසමයෙහි වනාහි පසේනදී කොසොල් රජුගේ ගබඩාවෙහි ශ්‍රමණයෙකුට හෝ බමුණෙකුට හෝ ගිතෙල් හෝ තලතෙල් හෝ ඇතිතාක් බොන්නට දෙනු ලැබේ. ගෙන යන්නට නො දෙයි. ඉක්බිති ඒ පිරිවැජියාට මෙබඳු අදහසක් විය. "පසේනදී කොසොල් රජුගේ ගබඩාවෙහි ශ්‍රමණයෙකුට හෝ බමුණෙකුට හෝ ගිතෙල් හෝ තලතෙල් හෝ ඇතිතාක් බොන්නට දෙනු ලැබේ. ගෙන යන්නට නො වෙයි. මම පසේනදී කොසොල් රජුගේ ගබඩාවට ගොස් යම් මැයට වැදීම සඳහා වන්නේ නම් ඒ තලතෙල් ඇතිතාක් බී ගෙදරට අවුත් වමාරා දෙන්නේ නම් ඉතා යෙහෙකි" යනුවෙනි. ඉක්බිති ඒ පිරිවැජියා පසේනදී කොසොල් රජුගේ ගබඩාවට ගොස් තෙල් ඇතිතාක් බී ගෙදරට අවුත් වමාරන්නට නො හැකි වන්නේ ම ය. විරේක කිරීමට ද නො හැකි වන්නේ ම ය.

නිවැරදි සිංහල පරිවර්තනය සඳහා ලකුණු හය (6) ම පිරිනමන ලදි.
ව්‍යාකරණ දෝෂ, අක්ෂර වින්‍යාස දෝෂ ඇත්නම් ඒ සඳහා එක ලකුණක් (1) අඩු කරන ලදි.
වචන මග හැර මනඃකල්පිත ව කර ඇති පරිවර්තනය සඳහා ද සුදුසු පරිදි ලකුණු අඩු කරන ලදි.
(අංකිත පද නිවැරදි ව පරිවර්තනය කර තිබේ දැයි අවධානය යොමු කරන ලදි.)

(ii) **සිංහලට නගන්න.**

මයං සහා'ව නික්ඛන්තා සරාපි ච භවාපි ච,
සහයෙව ගමිස්සාම නිබ්බාණපුරමුත්තමං.

නිබ්බාණය වජන්තීනං කිං වක්ඛාමීති සා වදං,
සහ සබ්බාහි නිග්ගච්ඡි භික්ඛුනීනිලයා තදා.

උපස්සයෙ යා'ධිවත්ථා දෙවතා තා ඛමන්තු මෙ,
භික්ඛුනීනිලයස්සෙදං පච්ඡිමං දස්සනං මම.

**(ලකුණු 06 යි)**


**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

- අපි එක් ව ම ගිහිගෙයින් ද භවයෙන් ද නික්මෙන්නාහු. එක් ව ම උතුම් නිවන් පුරයට යන්නෙමු.
- එවිට ඕ තොමෝ නිවනට යන්නියන්ට කුමක් කියම් දැයි කියමින් සියල්ලන් සමග භික්ෂුණී ආරාමයෙන් නික්මුණාය.

- මෙහෙණවරෙහි යම් අරක්ගත් දේවතා කෙනෙක් වෙත් නම් ඒ දේවතාවෝ මට ක්‍ෂමා කෙරෙත්වා මෙ මගේ මෙහෙණවරේ අවසන් දැක්මයි.

**එක් ගාථාවක් පරිවර්තනය සඳහා ලකුණු 2 බැගින් ගාථා තුනෙහි පරිවර්තනය සඳහා ලකුණු 6කි. පරිවර්තන දුර්වලතා සඳහා ලකුණු අඩු කිරීමේ දී ගද්‍ය ඡේදයේ ක්‍රමය අනුගමනය කරන ලදි.**


## 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා




මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එසේ වුවත් අංක 3.4 ප්‍රස්තාරය අනුව පිළිතුරු සපයා ඇත්තේ අපේක්‍ෂකයන්ගෙන් 89.35%ක් පමණ පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 21%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 28%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 25%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 26%ක් ද,

වශයෙන් අපේක්‍ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 26%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 49%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 6ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය නිර්දිෂ්ට පරිවර්තන කුසලතාව මනින ප්‍රශ්නයකි. පාලි භාෂාවෙන් දෙනු ලබන නිර්දිෂ්ට ගද්‍ය පාඨයක් හා ගාථා තුනක් මෙම ප්‍රශ්නයට ඇතුළත් වන අතර එක් කොටසකට ලකුණු 06 බැගින් හිමි වේ. අපේක්ෂකයන්ට පද ගතාර්ථ හෝ අන්වයානුකූල පරිවර්තනයක් සැපයීමට සිදු වේ. මේ සඳහා නිර්දිෂ්ට කොටස්වල අර්ථ පාඩම් කර තිබීම අවශ්‍ය වේ. ඒ ඒ පරිවර්තනවලට ලකුණු පිරිනමා ඇති ආකාරය අනුව පහසුතාව පිළිවෙළින් 60%ක් හා 43%ක් වේ.

සමස්තයක් වශයෙන් ගත් කළ පරිවර්තනවලට ලකුණු ලබා ගැනීම සාර්ථක වුවත් ගාථා පරිවර්තනයට ලකුණු ලබා ගැනීම අඩු මට්ටමකින් පවතින බව නිරීක්ෂණය වේ. ගද්‍ය පාඨයේ උක්තාඛ්‍යාත සම්බන්ධය ගැලපීම, මනඃකල්පිත පරිවර්තන දැක්වීම, ඇතැම් පද මගහැර පරිවර්තනය කර තිබීම වැනි කරුණු දුර්වලතා ලෙස දැකිය හැකිය. ගාථා පරිවර්තනවල අන්වය සකස් කර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨවලට අර්ථ පාඩම් කිරීම අත්‍යවශ්‍යය. ගුරු භවතුන් විසින් කොටස් වශයෙන් ගද්‍ය පද්‍ය කොටස් සිසුන් ලවා පරිවර්තනය කිරීමේ අභ්‍යාස සිදු කළ යුතු ය. දුර්වලතා හා අඩුපාඩු මගහරවා ගෙන සාර්ථක පරිවර්තනයක් ශිෂ්‍යයෝ ලවා ම සිදු කළ යුතු ය. ශිෂ්‍යයා විසින් ද ගුරු උපදෙස් පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. ශිෂ්‍යයින් සමග සංවාද කරමින් මෙන් ම එක් අයෙකු පාලියෙන් කියූ වාක්‍ය අනෙක් අයෙකු විසින් පරිවර්තනය කිරීම වැනි ක්‍රියාකාරකම් සඳහා යොමු වීම වඩාත් යෝග්‍ය වනු ඇත.

**02. ප්‍රශ්නය**

(i) **පාලියට නගන්න.**

(අ) මහණෙනි, වස් එළඹෙන්නට අනුදනිමි.

(ආ) නුඹලා විසින් කුසල් කළ යුතු ය.

(ඉ) එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ විහාරයට වැඩි සේක.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(අ) අනුජානාමි භික්ඛව වස්සං උපගන්තුං.

(ආ) තුම්හෙහි කත්තබ්බං කුසලං.

(ආ) තෙන සමයෙන භගවා විහාරං පාවිසි.

**(ලකුණු 06 යි)**

**ලකුණු දීමේ ක්‍රමය**

නිවැරදි එක් පාලි වාක්‍යයකට ලකුණු 2 බැගින් පිරිනමන ලදි. පරිවර්තනයේ එක් දෝෂයක් හෝ ඇත්නම් 1 ලකුණක් අඩු කරන ලදි. වචන මගහැර කර ඇති පරිවර්තනයකට ලකුණු ලබාදීම සිදු නොකරන ලදි

**(ii) පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන වච්ඡගොත්තො පරිබ්බාජකො එකපුණ්ඩරීකෙ පරිබ්බාජකාරාමෙ පටිවසති. අථ ඛො සො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලියං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි. අතිප්පගො ඛො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුං. යන්නූනාහං යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො, යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසංකමෙය්‍යන්ති. අථ ඛො භගවා යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසංකමි. අද්දසා ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච. එතු ඛො භන්තෙ, භගවා. ස්වාගතං භන්තෙ, භගවතො. චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු, භන්තෙ, භගවා ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. වච්ඡගොත්තොපි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි.

(අ) වච්ඡගොත්ත පරිබ්‍රාජකයා වාසය කළේ කොහි ද? *(ලකුණු 01)*

(ආ) භාග්‍යවතුන් වහන්සේට මෙහිදී පහළ වූ අදහස කුමක් ද? *(ලකුණු 01)*

(ඉ) අතිප්පගො හා ස්වාගතං යන පදවල අර්ථ දක්වන්න. *(ලකුණු 02)*

(ඊ) මෙම ඡේදයෙන් බුදුහිමියන්ගේ කිනම් ගුණයක් ප්‍රකට වේද? *(ලකුණු 02)*

**පිළිතුර**


(අ) ඒකපුණ්ඩරික නම් වූ පරිබ්‍රාජකාරාමයෙහි.

(ආ) පිණ්ඩපාතය වැඩීමට කල් වැඩි ය. ඒකපුණ්ඩරීක නම් වූ පරිබ්‍රාජකාරාමය යම් තැනක ද වච්ඡගොත්ත පරිබ්‍රාජකයා යම් තැනක ද එතැනට එළඹෙන්නේ නම් මැනවි.

(ඉ) • කල් වැඩිය (ඉතා උදැසන)
• යහපත් පැමිණීමක් වේවා.

(ඊ) ප්‍රියශීලීබව/ සාමයික සහජීවනය

## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





02 ප්‍රශ්නය ද අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයකි. අංක 3.4 ප්‍රස්තාරය අනුව මේ ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 87.1%ක් පමණ පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 54%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 28%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 15%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 3%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 3%කි. අපේක්ෂක-යන්ගෙන් 54%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ




මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වන අතර (1) කොටස මාධ්‍ය භාෂාවෙන් ඇති වාක්‍ය තුන පාලි භාෂාවට නැගිය යුතුය. නිවැරදි එක් වාක්‍යකට ලකුණු දෙක බැගින් හිමි වේ. වැරදි 2කට වඩා වැඩි වාක්‍යවලට ලකුණු හිමි නොවේ. සමස්තය සලකා වාක්‍ය 3ටම ලකුණු 3කින් සුදුසු ලකුණක් දීමේ හැකියාවක් පැවතුණි. (ii) කොටසේ දී ඇති පාලි ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට මාධ්‍ය භාෂාවෙන් පිළිතුරු සැපයිය යුතු ය. එහි අනුකොටස් හතරකි. ඒ ඒ කොටසට පිළිවෙළින් ලකුණු 1, 1, 2, 2 වශයෙන් ලකුණු 6ක් හිමි වේ.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී පළමු කොටසේ (අ), (ඉ) අනුකොටස්වල පහසුතාව 30%ක සීමාව ඉක්මවා තිබූ අතර (ආ) අනුකොටසේ පහසුතාව 26%කි. දෙවන කොටසේ (අ) අනුකොටසේ පහසුතාව 72%ක් වන අතර (ආ), (ඉ) හා (ඊ) අනුකොටස්වල පහසුතාව පිළිවෙළින් 39%, 23%හා 12%ක් වේ.

මෙම ප්‍රශ්නයේ පළමු කොටසට පිළිතුරු සැපයීමේ දී මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවට වාක්‍ය පරිවර්තනය කිරීමේ හැකියාව ලබා තිබිය යුතු ය. මේ සඳහා පාලි භාෂාවතරණය 1 පොතවත් පරිවර්තනය කර තිබීම වැදගත් වනු ඇත. ඒ ඒ විභක්තියට ගැළපෙන අයුරින් පාලි පද ලිවීම සිසුන්ට දුෂ්කර වී තිබේ. නියමානුකූලව විභක්තිය යෙදීමට අපොහොසත්වීම මෙම ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම දුෂ්කර වීමට හේතුව ලෙස දැක්විය හැකිය.

දෙවන කොටසේ අනුකොටස්වලට මාධ්‍ය භාෂාවෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය. ඒ සඳහා ද ලකුණු ලබා දීමට මණ්ඩලයේ ඒකඟතාව හිමි විය. (ii) (ඉ) හා (ඊ) අනුකොටස්වල සාධනය අඩු වීමට හේතුව ලෙස අදාළ වචනවල තේරුම නොදැනීම දැක්විය හැකිය.

මේ සඳහා පාලි භාෂාව 5 පොතේ ඇති ගද්‍ය පද්‍ය කොටස් කියවා අර්ථාවබෝධය ලබා ගත යුතු ය. ගුරු භවතුන් විසින් පදානුපදිකව පරිවර්තනය කර සිසුන් ලවා ද පරිවර්තනය කරවිය යුතු ය. එකී පාඨයන්හි ඇති සුවිශේෂී වචනවල අර්ථ ලිවීමට හුරුව ලබා දිය යුතු ය. තවද ගුරුභවතුන් විසින් නිවැරදිව ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පිළිබඳව විධිමත් ලෙස සිසුන් දැනුවත් කළ යුතු අතර පරිවර්තනය හා අභ්‍යාස කරවීම තව දුරටත් නිවැරදි ව අධීක්ෂණය කළ යුතු ය. භාෂාව ප්‍රගුණ කිරීමට ශබ්ද කෝෂ භාවිත කිරීම ද වැදගත් වේ. එමඟින් දුෂ්කර වචනවලට අර්ථ සපයාගත හැකිය.

## II කොටස

**03 ප්‍රශ්නය**

(i) සෝෂාක්ෂර හා අසෝෂාක්ෂර පිළිබඳ දැක්වෙන බාලාවතාර පාඨ ලියන්න. **(ලකුණු 02 යි)**

අසෝෂාක්ෂර — වග්ගානං පඨමදුතියා සො චාඝොසා
සෝෂාක්ෂර — ළන්තාඤ්ඤෙ ඝොසා

(ii) පහත සඳහන් පද විසන්ධි කරන්න. **(ලකුණු 04 යි)**

(I) අන්වෙති (II) යානීධ
(III) භූවාදයො (IV) යථරිව
(V) ඡායාව (VI) මහබ්භය
(VII) තන්ධනං (VIII) බුද්ධසාසනං

(I) අනු + එති (II) යානි + ඉධ
(III) භූ + ආදයො (IV) යථා + ඉව
(V) ඡායා + ඉව (VI) මහා + භය
(VII) තං + ධනං (VIII) බුද්ධානං + සාසනං

(iii) පහත සඳහන් සූත්‍රවල අර්ථය ලියා උදාහරණය බැගින් සපයන්න. **(ලකුණු 06 යි)**

(I) ක්වචාසවණ්ණං ලුත්තෙ (II) දීඝ (III) නිග්ගහීතඤ්ච

(I) ස්වරයා ලොප් වූ කල්හි පරස්වරයට ඇතැම් තැනක දී අසවර්ණාදේශය වේ.
ඉ, ඊ. එ, බන්ධුස්ස + ඉව = බන්ධුස්සෙව
උ, ඌ, ඔ ගංගා + උදය = ගංගොදය

(II) පරස්වර දීර්ඝ වේ.
යානි + ඉධ = යානීධ

(III) ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් හෝ පර කල්හි නිග්ගහීතයක් ආගම වේ.
චක්ඛු + අනිච්චං = චක්ඛුං අනිච්චං
අව + සිරො = අවං සිරො


**ලකුණු දීමේ ක්‍රමය**

i සූත්‍ර පාඨ නිවැරදි ව ලියා තිබුණේ නම් 1 බැගින් ලකුණු 2 යි.

ii නිවැරදි එක් විසන්ධි කිරීමකට ලකුණු 1/2 බැගින් ලකුණු 4 යි.

iii නිවැරදි ව සූත්‍රවල අර්ථ ලියා තිබීමට 1 බැගින් ලකුණු 3ක් ද, එක් උදාහරණයකට ලකුණු 1 බැගින් ලකුණු 3ක් වශයෙන් ලකුණු 6 යි. (2 + 4 + 6 = 12)

## 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





මෙම ප්‍රශ්නය තෝරා ගැනීමට අවස්ථාව ලබා දී ඇති ප්‍රශ්නයකි. අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 61.67%කි. මේ සඳහා ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 45%ක් ද,
ලකුණු 04 - 06 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 07 - 09 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 6%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 6%කි. අපේක්ෂකයන්ගෙන් 81%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 6ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය වර්ණ මාලාවෙන් හා සන්ධි යන පාඩම්වලින් සැකසෙන අතර අනුකොටස් තුනකි. එම කොටස්වලට පිළිවෙළින් ලකුණු 2, 4, 6 වශයෙන් ලකුණු 12ක් හිමි වේ. පළමු අනුකොටසට සූත්‍ර පාඨ දෙක ලිවීමෙන් එක් පාඨයකට එක් ලකුණු බැගින් ලකුණු 2ක් පිරිනමා ඇත. දෙවන අනුකොටසට සන්ධි පද 8ක් ලබා දී ඒවා විසන්ධි කොට දැක්වීම සිදු කළ යුතු වූ අතර එක් නිවැරදි පිළිතුරකට ලකුණු 1/2 බැගින් ලකුණු 4ක් ද, පිරිනමා ඇත. තෙවන කොටසට බාලාවතාර සූත්‍ර 3ක අර්ථය ලියන නිදසුන බැගින් සැපයීමට සිසුන්ට අවස්ථාව දී තිබේ. මෙම ප්‍රශ්නයේ (i), (ii) ලෙස කොටස් දෙකෙහි හා (iii) කොටසෙහි අනුකොටස් තුනෙහි පහසුතාව අනුපිළිවෙළින් 71%, 43%, 20%, 19% හා 9%කි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී වර්ණමාලාව පිළිබඳවත් සන්ධි පිළිබඳවත් අවබෝධයක් ලබා තිබිය යුතු ය. මෙම ප්‍රශ්න පෙළ පොත ඇසුරෙන් සැකසෙන බැවින් මේ සඳහා මෙකී පාඩම් ආවරණය වී තිබිය යුතු ය. දැනුම හා මතකය ඇසුරින්ම මේ ප්‍රශ්නය සැකසී ඇති නිසා අමතකව යාමෙන් පිළිතුර වැරදී යා හැකිය. (i) කොටසට තරමක් සාර්ථකව පිළිතුරු සපයා ඇති අතර (ii) හා (iii) කොටස්වලට පිළිතුරු සැපයීමේදී ශිෂ්‍ය සාධනය අඩු මට්ටමක පවතී. ඊට හේතුව වන්නේ සන්ධි පිළිබඳ නිවැරදි වැටහීමක් නොතිබීම විය හැකිය. පෙළ පොතේ සන්ධි පාඩමේ ඇති සන්ධි පද විසන්ධි කිරීමටත් විසන්ධි පද සන්ධි කිරීමටත්, සූත්‍ර කටපාඩම් කිරීම. සූත්‍ර පැහැදිලි කිරීමටත්, ශිෂ්‍යයන් උනන්දු කරවිය යුතු ය. එකී වචන සහිත නිදසුනක් වාක්‍ය ඇසුරින් සන්ධි විසන්ධි කිරීමටත්, විසන්ධි සන්ධි කිරීමටත් සිසුන් පෙළඹවිය යුතු ය. මේ සඳහා දෘශ්‍යාධාර භාවිතා කිරීම ඉතා වැදගත් ය.

**04. ප්‍රශ්නය**

(i) පහත සඳහන් පදවල බහුවචන රූප දක්වන්න. **(ලකුණු 02 යි)**

(I) තස්ස (II) භගවතො (III) අරහතො (IV) සම්මාසම්බුද්ධස්ස

(I) තස්ස තෙසං/ තෙසානං (නෙසං/ නෙසානං)
(II) භගවතො භගවතං/ භගවන්තානං
(III) අරහතො අරහතං/ අරහන්තානං
(IV) සම්මාසම්බුද්ධස්ස සම්මාසම්බුද්ධානං

(ii) පහත පාඨවල තද කළු අකුරින් මුද්‍රිත නාම පදයන්හි විභක්තිය නම් කරන්න. **(ලකුණු 04 යි)**

(I) **පුත්ත,** ඉභාගච්ඡ
(II) දාරකො **මඤ්චෙ** සයති
(III) සො **පාදෙන** කන්දුකං පහරති
(IV) සමණස්ස **සච්චං** රොචතෙ

(I) ආලපන/ සම්බෝධන විභක්ති
(II) සත්තමී/ ආධාර විභක්ති
(III) කරණ/ තතියා විභක්ති
(IV) පඨමා විභක්ති විභක්ති

(iii) තද කළු අකුරින් මුද්‍රිත පදවල ආඛ්‍යාත විභක්තිය නම් කරන්න. **(ලකුණු 06 යි)**

(I) අඤ්ඤතරා දෙවතා එකමන්තං **අට්ඨාසි**
(II) **අගා** ජෙතවනං ජිනො
(III) ඉදානි මයං ධම්මං ච විනයං ච **සංගායෙය්‍යාම**
(IV) සබ්බෙ'ව භූතා සුමනා **භවන්තු**
(V) කිලන්තොස්මි ආනන්ද **නිපජ්ජිස්සාමි**
(VI) වජ්ජිගාම උපනිස්සාය **විහරති**

(I) **අට්ඨාසි** - අජ්ජතනී ආඛ්‍යාත විභක්තිය
(II) **අගා** - හීයත්තනී ආඛ්‍යාත විභක්තිය
(III) **සංගායෙය්‍යාම** - සත්තමී ආඛ්‍යාත විභක්තිය
(IV) භවන්තු - පඤ්චමී ආඛ්‍යාත විභක්තිය
(V) නිපජ්ජිස්සාමි - භවිස්සන්ති ආඛ්‍යාත විභක්තිය
(VI) විහරති - වත්තමාන ආඛ්‍යාත විභක්තිය


**(ලකුණු 06 යි)**

**ලකුණු දීමේ ක්‍රමය**

i නිවැරදි බහුවචන රූප දැක්වීමකට ලකුණු 1/2 බැගින් ලකුණු 2 යි.
ii නාමපද හතරෙහි විභක්ති නම් කිරීමට ලකුණු 1 බැගින් ලකුණු 4 යි.
iii එක් නිවැරදි ආඛ්‍යාත නම් කිරීමට ලකුණු 1 බැගින් ලකුණු 6 යි.

**(2 + 4 + 6 = 12)**

## 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා





මෙම ප්‍රශ්නය ද අපේක්ෂකයන්ගේ අභිමතය පරිදි තෝරා ගැනීමට ඉඩ ලබා දී ඇති ප්‍රශ්නයකි. අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්‍ෂකයන් ප්‍රතිශතය 42.43%කි. මේ සඳහා ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 40%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 29%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 22%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 9%ක් ද,

වශයෙන් අපේක්‍ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

4 ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 9%කි. අපේක්ෂකයන්ගෙන් 69%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 6ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් තුනකින් යුක්තය. එම කොටස් නාම වර නැගීම හා ආඛ්‍යාත වර නැගීම යන පාඩම් ඇසුරෙන් සකසා ඇත. (i), (ii) කොටස් නාම වර නැගීම ඇසුරෙන් ද (iii) කොටස ආඛ්‍යාත විභක්ති ඇසුරෙන් ද සැකසී ඇත.

(i) කොටස සඳහා පහසුතාව 30%ක් ද (ii) කොටස සඳහා පහසුතාව 43%ක් ද (iii) කොටස සඳහා පහසුතාව 33%ක් ද වේ. මෙම අඩු සාධනය සඳහා විෂය කොටස් මගහැර ඉගැන්වීම හේතු විය හැකි අතර ශිෂ්‍යයන් නාම විභක්ති හා ආඛ්‍යාත විභක්ති පටලවා ගන්නා ස්වරූපයක් ද නිරීක්‍ෂණය විය. ක්‍රියා විභක්තිය නම් කිරීමේ දී සාම්ප්‍රදායිකව කට පාඩම් කරගෙන තිබුණත් ව්‍යවහාරයෙන් ප්‍රශ්න සැකසීමේ එය ගලපාගෙන තේරුම් ගැනීමට අපහසු වූ බවත් පෙනේ. තව ද ඒ ඒ විභක්තිවලට අදාළ ව සිසුන් ලවා වාක්‍ය පරිවර්තනය කරවීම හා අර්ථ සහිතව කට පාඩම් නොගැනීමත් නොලියවීමත් පිළිතුරු සැපයීමේ දී සිසුන් අඩු සාධන මට්ටමක් ලබා ගැනීමට හේතු ලෙස පෙන්වා දිය හැකිය.

**05. ප්‍රශ්නය**

**(i) "නාමානං සමාසො යුත්තත්‍ථො" යන්නෙහි අර්ථය ලියා උදාහරණයක් සපයන්න.**

**(ලකුණු 02 යි)**

යුක්තාර්ථවත් අන්‍යෝන්‍ය සම්බන්ධය ඇති පදයන්ගේ ගැළපීම සමාස නම් වේ.
උදාහරණ රඤ්ඤො පුරිසො - රාජපුරිසො

**(ii) පහත සඳහන් තද්ධිත පදවල අර්ථය ලියන්න.**

| | | |
|---|---|---|
| (I) | කච්චානො | කච්චගේ පුතා |
| (II) | සාකටිකො | ගැල්කරුවා / කරත්තකාරයා |
| (III) | පාපිට්ඨො | පාපතර වූ |
| (IV) | ආරොග්‍යං | නීරෝගී බව |

**(ලකුණු 04 යි)**

**(iii) පහත සඳහන් සමාස පද කුමන සමාසයට අයත් දැයි දක්වන්න.**

| | | |
|---|---|---|
| (I) | උපනගරං | අව්‍යයීභාව සමාසය |
| (II) | දසබලො | බහුබ්බීහි සමාසය |
| (III) | ඨංසමකසං | ද්වන්ද සමාසය |
| (IV) | රාජභයං | තප්පුරිස සමාසය |
| (V) | ගුණධනං | කම්මධාරය සමාසය |
| (VI) | චතුසච්චං | දිගු සමාසය |


**(ලකුණු 06 යි)**

**ලකුණු දීමේ ක්‍රමය**

i අර්ථය දැක්වීමට 1 ලකුණක් ද, උදාහරණ දැක්වීමට 1 ලකුණක් ද බැගින් ලකුණු 2යි.
ii නිවැරදි අර්ථ දැක්වීමට ලකුණු 1 බැගින් ලකුණු 4යි.
iii නිවැරදි නම් කිරීමට ලකුණු 1 බැගින් ලකුණු 6යි. **(2 + 4 + 6 = 12)**
(iii කොටසේ vi වචනයෙහි මුද්‍රණ දෝෂයක් ඇති බැවින් අදාළ ලකුණ ප්‍රදානය කරන ලදි.)

## 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා


**05 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




5 ප්‍රශ්නය ද අපේක්ෂකයන්ගේ අභිමතය පරිදි තෝරාගෙන පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 27.48%කි. මෙම ප්‍රශ්නය සඳහා ද හිමි ලකුණු ප්‍රමාණය 12කි.

ඉන් 00 - 03 ප්‍රාන්තරයේ 40%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 27%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 22%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 11%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

5 ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 11%කි. ලකුණු 6ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් ප්‍රතිශතය 67%කි.




මෙම ප්‍රශ්නය සමාස හා තද්ධිත ඇසුරින් අසනු ලබන ප්‍රශ්නයකි. මෙහි ද කොටස් තුනකි. (i), (iii) කොටස් සමාස පිළිබඳ විමසීමට ද (ii) කොටස තද්ධිත පිළිබඳ විමසීමට ද යොදා ගෙන තිබේ. ඒ ඒ කොටස්වලට පිළිවෙළින් ලකුණු 2, 6, 4 වශයෙන් හිමි වේ.

(i) කොටස සඳහා පහසුතාව 28%ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 48%ක් ද, (iii) කොටස සඳහා පහසුතාව 42%ක් ද වේ. (ii) කොටසට පිළිතුරු සැපයීමේ දී තරමක් සාර්ථක වී ඇති අතර සමාස පාඩමක් ලෙස උගන්වන නිසා එසේ සාර්ථක වී ඇති බව සිතිය හැකිය. (i) කොටසේ සූත්‍ර පාඨය පිළිබඳ පැහැදිලි වැටහීමක් තිබූ බවක් පෙනෙන්නට නොතිබිණි. (ii) කොටසට පිළිතුරු සැපයීමේ දී වචනවල අර්ථ මතක තබා ගැනීම නිසා සාර්ථක බවක් පෙන්නුම් කර ඇත. පෙළ පොතේ නිවැරදි පාඩම්, සූත්‍ර පාඨයන්හි අර්ථ හා පරිවර්තන සහිතව ඉගැන්වීම වැදගත් වේ. එහි ඇති සූත්‍ර පාඨයන්හි අර්ථ හා ඒවාට නිදසුන් ද මතකයේ තබා ගැනීම සිසුන්ට පැවරෙන වගකීමකි.

**06 ප්‍රශ්නය**

**(i) පහත සඳහන් පාලි සංඛ්‍යා නාම ඉලක්කමෙන් ලියන්න.**

(I) චුද්දස (II) ඡත්තිංසති
(III) ද්වාසට්ඨී (IV) එකූනසත

(I) දාහතර (14) (II) තිස්හය (36)
(III) හැටදෙක (62) (IV) අනූනවය (99) **(ලකුණු 02)**

**(ii) පහත වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.**

(I) අහං ඔදනං පචාමි
(II) චොරා අස්සෙ චොරෙන්ති
(III) මිගො සීහං පස්සති
(IV) කුමාරො බුද්ධං වන්දති

(I) මයා ඔදනො/ඔදනං පච්චෙ.
(II) චොරෙහි අස්සා චොරීයන්තෙ.
(III) මිගෙන සීහො පස්සීයතෙ.
(IV) කුමාරෙන බුද්ධො වන්දීයතෙ. **(ලකුණු 04)**

**(iii) පහත දැක්වෙන මාතෘකා අතුරින් එකක් තෝරා ගෙන වාක්‍ය හයකින් යුතු පාලි රචනාවක් ලියන්න.**

(I) මම පාඨසාලා (II) අනුරාධපුරං (III) ආරොග්‍යපරමා ලාභා

**(ලකුණු 06)**

**ලකුණු දීමේ ක්‍රමය**


i නිවැරදි අර්ථ දැක්වීමකට ලකුණු 1/2 බැගින් ලකුණු 2 යි.

ii නිවැරදි එක් වාක්‍යයකට ලකුණු 1 බැගින් ලකුණු 4 යි.

iii පළමු ක්‍රමය - මාතෘකාවට අදාළ ව ලියූ එක් වාක්‍යයකට ලකුණු 1 බැගින් ලකුණු 6යි.
දෙවන ක්‍රමය - රචනාවට සමස්තය සලකා ලකුණු පිරිනැමුවේ නම් උපරිමය ලකුණු 3කි.

**(2 + 4 + 6 = 12)**

## 6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





මෙම ප්‍රශ්නය තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයකි. අංක 3.4 ප්‍රස්තාරය අනුව පිළිතුරු සපයා ඇති අපේක්ෂක සංඛ්‍යාව 31.03%කි. මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 37%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 38%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 16%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 09%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

6 ප්‍රශ්නය සඳහා ලකුණු 07ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 25%කි. අපේක්ෂකයන්ගෙන් 75%ක්ම ලකුණු 06ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් තුනකින් යුක්තවන අතර සංඛ්‍යා පිළිබඳ අවබෝධයත්, කර්ම කාරක පිළිබඳ අවබෝධයත් මැන බැලේ. (i) කොටස සංඛ්‍යා අවබෝධයටත් (ii) කොටස කර්ම කාරකයට හැරවීමටත් (iii) කොටස වාක්‍ය රචනයටත් වෙන් කර තිබේ.

(i) කොටස සඳහා පහසුතාව 42%ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 9%ක් ද, (iii) කොටසෙහි (i) වන අනුකොටස සඳහා පහසුතාව 37%ක් ද, II අනුකොටස සඳහා 44%ක් ද III අනුකොටස සඳහා 20%ක් ද වේ. (i) කොටසේ සංඛ්‍යා නාම ඉලක්කමෙන් ලිවීම හා (iii) කොටසේ වාක්‍ය රචනය තරමක් දුරට සාර්ථක වී ඇති අතර (ii) කොටසේ වාක්‍ය කර්ම කාරකයට හැරවීමට අදාළ ව ශිෂ්‍ය සාධනය ඉතා අඩු මට්ටමකින් පැවති බව නිරීක්ෂණය විය.

විෂය නිර්දේශය ආවරණය කිරීම හා පෙළ පොතේ සෑම අංශයකටම අවධානය යොමු කිරීම වැදගත් වේ. පාඩම් මගහැර ඉගැන්වීම, නොසලකා හැරීම නොකළ යුතු ය. සංඛ්‍යා ඉලක්කමෙනුත්, පාලි වචනයෙනුත් ලිවීමට පුරුදු කරවිය යුතු ය. සරල වාක්‍ය නිර්මාණය හා මාතෘකාවලට රචනා ලියවීම බාහිර ක්‍රියාකාරකම් ලෙස සිදු කිරීම (උදය රැස්වීම හා ශිෂ්‍ය සමිතිය තුළින්) මෙම විෂය නිපුණතාව සාර්ථක කරගත හැකිය.

**07 ප්‍රශ්නය**

**(i) පහත දැක්වෙන නිපාත පදවල අර්ථ ලියා දක්වන්න. (ලකුණු 02)**

(I) සමං (II) අභික්ඛණං

(III) සචෙ (IV) විනා

(I) සමග / සහ / හා (II) නිතර / නිරන්තරයෙන්

(III) ඉදින් / එසේනම් (IV) හැර / තොරව

**(ii) පහත සඳහන් වාක්‍ය යුගල පූර්ව ක්‍රියාපද යොදා ගනිමින් තනි වාක්‍ය සේ ලියන්න. (ලකුණු 04)**

(I) මාතා පුප්ඵානි ඔචිනාති / සා බුද්ධං පූජෙති

(II) මිගො සීහං පස්සති / සො වෙගෙන ධාවති

(III) භික්ඛවො උපොසථාගාරං ගච්ඡන්ති / තෙ විනයං වාචෙන්ති

(IV) දෙවො ධම්ම සුණාති / සො ආකාසෙන ගච්ඡති

(I) මාතා පුප්ඵානි ඔචිනිත්වා බුද්ධං පූජෙති

(II) මිගො සීහං දිස්වා වෙගෙන ධාවති

(III) භික්ඛවො උපොසථාගාරං ගන්ත්වා විනයං වාචෙන්ති

(IV) දෙවො ධම්මං සුත්වා ආකාසෙන ගච්ඡති

**(iii) පහත සඳහන් බාලාවතාර සූත්‍ර සුදුසු පද යොදා සම්පූර්ණ කරන්න. (ලකුණු 06)**

(I) .............................................. චාගමා

(II) තතො ච ....................................

(III) ලොපඤ්ච ..................................

(IV) අනුමති ............................. සත්තමී

(V) ................................. බහුබ්බීහි

(VI) යස්මාදපෙති ............................... තදපාදානං

(I) **යවමදනතරළා** චාගමා

(II) තතො ච **විභත්තියො**

(III) ලොපඤ්ච **තත්‍රාකාරො**

(IV) අනුමති පරිකප්පත්තෙසු සත්තමී

(V) **අඤ්ඤපදත්‍ථෙසු** බහුබ්බීහි

(VI) යස්මාදපෙති භයමාදත්තෙ තදපාදානං


**ලකුණු දීමේ ක්‍රමය**

i නිවැරදි අර්ථ දැක්වීමකට ලකුණු 1/2 බැගින් ලකුණු 2යි.

ii නිවැරදි වාක්‍යයක් ලිවීම සඳහා ලකුණු 1 බැගින් ලකුණු 4යි.

iii නිවැරදි ව සූත්‍ර සම්පූර්ණ කිරීමකට ලකුණු 1 බැගින් ලකුණු 6යි. **(2 + 4 + 6 = 12)**

## 7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





මෙම ප්‍රශ්නය තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයක් වන අතර අංක 3.4 ප්‍රස්තාරය අනුව පිළිතුරු සපයා ඇති අපේක්ෂක ප්‍රතිශතය 48.97%කි.

මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 17%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 22%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 34%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 27%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

07 ප්‍රශ්නය සඳහා ලකුණු 03ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 17%ක් වන අතර අපේක්ෂක-යන්ගෙන් 61%ක් ලකුණු 7ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නය ද (i), (ii), (iii) වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විතය. නිපාත පද, පූර්වක්‍රියා හා හිස්තැන් පිරවීම යන විෂය කරුණු මෙමගින් මැන බැලේ. මෙම කොටස්වලට පිළිවෙළින් 2, 4, 6 වශයෙන් ලකුණු 12ක් පිරිනැමේ.

(i) කොටස සඳහා පහසුතාව 41%ක් ද (ii) කොටස සඳහා පහසුතාව 66%ක් ද (iii) කොටස සඳහා පහසුතාව 50%ක් ද වේ. (i) කොටස සඳහා ශිෂ්‍ය සාධනය අවම මට්ටමක පවතී. නිපාත පදවල සිංහල අර්ථ මතක තබා ගැනීම සඳහා සිසුන් උනන්දු කිරීම හා පාඩම් ගැනීමේ දී පාලි නිපාත පදයේ සිංහල අර්ථය ගුරුවරයා සිසුන්ගෙන් විමසීම ඉතා අගනේය. (ii) කොටසේ පූර්ව ක්‍රියා යොදා වාක්‍ය නිර්මාණ කිරීම සඳහා ශිෂ්‍ය සාධනය සාමාන්‍ය හොඳ මට්ටමක පවතියි. එම නිසා ගුරුභවතුන් විසින් තවදුරටත් වාක්‍ය සම්බන්ධ කිරීමට පූර්ව ක්‍රියා යොදා ගන්නා ආකාරය පැහැදිලි කළ යුතු ය. (iii) කොටසට පිළිතුරු සැපයීමේදී දක්වා ඇති දුර්වලතා වන්නේ අදාළ විග්‍රහ වාක්‍යයන් මතකයෙන් ලියා දැක්වීමට නොහැකි වීමයි. එබැවින් නියමිත පාඩම්වල ඇති විග්‍රහ වාක්‍ය ගාථා, පාඨ, වාචෝද්ගත කර තිබිය යුතු ය. ගුරුභවතුන් ගුරු අත්පොත භාවිත කිරීම වැදගත් වේ. ඒ ඒ පාඩම්වලට අදාළ උපදෙස් වෙන වෙනම ඒවායේ ඇතුළත් කොට තිබේ.

**08 ප්‍රශ්නය**

**(i) උදාන පාලියේ නිර්දිෂ්ට සූත්‍රයක දැක්වෙන චරිතයක් හඳුන්වා දෙන්න. (ලකුණු 02)**

සංගාමජී, ගබ්භිනී, නන්‍ද යන සූත්‍රයන්හි එන පහත සඳහන් චරිත අතුරින් එකක් කෙටියෙන් හඳුන්වා තිබීම ප්‍රමාණවත් ය.

| | |
|---|---|
| සංගාමජී තෙරුන්, | පුරාණ දුතියිකා |
| දහරා මානවිකා, | පරිබ්‍රාජකයා |
| කොසොල් රජතුමා, | නන්‍ද තෙරුන් |
| ජනපද කල්‍යාණි, | පන්සියයක් අප්සරාවෝ |
| යහළු භික්ෂූන්, | එක්තරා දේවතාවෙක් |
| පිළිස්සුණු වැදිරිය, | බුදුන් වහන්සේ |

**(ii) සංගාමජී සූත්‍රයේ සාරාංශය ලියා දක්වන්න. (ලකුණු 04)**

සංගාමජී සූත්‍රයේ සාරාංශය ලියා දක්වන්න.
සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ සිටි තථාගතයන් වහන්සේ දැකීමට පැමිණි සංගාමජී තෙරුන් වහන්සේ දිවා විහරණය පිණිස රුක්මුලක වැඩ සිටියහ. එසේ සිටින අතර තමන් වහන්සේගේ පෙර කල භාර්යාව ඒ බව දැන තම කුඩා දරුවා ද රැගෙන සංගාමජී තෙරුන් වහන්සේ දැකීමට පැමිණියා ය. ඇය සිය දරුවා උන්වහන්සේ ඉදිරියේ දරුවා තබා සැඟ වී බලා සිටිය ද උන්වහන්සේ දරුවා පිළිබඳ කිසිදු අවධානයක් නො කළ හෙයින් දරුවන්ගෙන් ද මොහුට ප්‍රයෝජන නැතැයි සිතා දරුවා රැගෙන ආපසු ගියාය. ඇයගේ මේ විප්‍රකාර දුටු තථාගතයන් වහන්සේ "එන්නිය දැක සතුටු නො වන යන්නය දැක ශෝක නො කරන අලීම්වලින් මිඳුණු ඒ සංගාමජී භික්ෂුව බ්‍රාහ්මණයෙකැයි" දේශනා කළහ.

**(iii) අපදානපාළිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06)**


- බුද්ධකනිකායට අයත් ග්‍රන්ථ මාලවේ 13වන ග්‍රන්ථය අපදානපාළිය යි.
- පෙර කරන ලද කුශලයෙන් ජනිත උදාර චරිතයක අතීත සිදුවීම් ගෙන හැර දැක්වීම අපදාන ශබ්දයේ අර්ථය යි.
- නවංගසත්‍ථුසාසනයෙහි ද අපදාන යන්න ඇතුළත් කොට තිබේ.
- අපදාන ප්‍රධාන වශයෙන් කොටස් 04 කි.
  බුද්ධාපදාන
  පච්චේක බුද්ධාපදාන
  ථෙරාපදාන
  ථෙරී අපදාන වශයෙනි.
- අපදානපාළියේ වර්ග 65ක් පමණ වේ. අපදාන 592ක් ඇත. ගාථා 7619ක් ඇත.
- බුද්ධාපදාන 1ක්, පච්චේක බුද්ධාපදාන 1ක්, ථෙරාපදාන 550ක්, ථෙරී අපදාන 40ක් මෙහි ඇතුළත් ය.
- සම්පූර්ණ අපදානපාළිය පද්‍යයෙන් රචනා වී ඇත.
- අපදානපාළිය ථෙර ථෙරීන්ගේ අතීත චරිත කථා දක්වනු පිණිස රචනා වී ඇත.
- අතීතභවයන්හි කළ කුශලාකුශල ක්‍රියා විස්තරයන්ට අමතර ව වර්තමාන චරිත සිද්ධි ද විස්තර වේ.
- සර්වාස්තිවාදී නමැති නිකායෙහි අවදානශතක, දිව්‍යවදාන වැනි ග්‍රන්ථවල ද බුද්ධකාලීන හා පශ්චාත්කාලීන තෙරුවරුන්ගේ චරිත අන්තර්ගත වෙයි.

**ලකුණු දීමේ ක්‍රමය**

i නිවැරදි පිළිතුරට ලකුණු 2යි.
ii නිවැරදි පිළිතුරට ලකුණු 4යි.
iii නිවැරදි පිළිතුරට ලකුණු ලකුණු 6යි.


ඌනතා තිබුණේ නම් සුදුසු පරිදි ලකුණු අඩු කිරීම සිදු කරන ලදී. **(2 + 4 + 6 = 12)**

## 8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




මෙම ප්‍රශ්නය ද තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයක් වන අතර අංක 3.4 ප්‍රස්තාරය අනුව පිළිතුරු සපයා ඇති අපේක්ෂක සංඛ්‍යාව 48.04%කි.
මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ. ඉන්
00 - 03 ප්‍රාන්තරයේ 16%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 28%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 38%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 18%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.


08 ප්‍රශ්නය සඳහා 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 18%කි.
අපේක්ෂකයන් අතුරෙන් 44%ක් ලකුණු 6ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ ද කොටස් තුනක් ඇති අතර පාලි සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ අවධානය යොමු කර ඇත. මේ සඳහා (i) කොටස ලකුණු 2ක් ද (ii) කොටසට ලකුණු 4ක් ද (iii) කොටසට ලකුණු 6ක් ද වශයෙන් මුළු ලකුණු 12ක් හිමිවේ.

(i) කොටස සඳහා පහසුතාව 62%ක් ද, (ii) කොටස සඳහා පසුතාව 76%ක් ද, (iii) කොටස සඳහා පහසුතාව 43%ක් ද වේ. මෙය සිසුන්ට වැඩි වශයෙන් පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්නයක් ලෙස දැක්විය හැකිය. මෙහි (i), (ii) යන ප්‍රශ්නවල සාධන මට්ටම ඉතා ඉහළ මට්ටමක පැවති අතර (iii) ප්‍රශ්නය සඳහා ද සාධන මට්ටම පෙර වර්ෂවලට වඩා ඉහළ මට්ටමකින් ඇත. තවද ගුරු භවතුන් විසින් උදාන හා අපදාන පාලියට අදාළ ත්‍රිපිටක මූලාශ්‍ර පිළිබඳ ව සිසුන්ව තවත් තොරතුරු සෙවීමට උනන්දු කළ යුතු අතර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පිළිබඳ ව තවත් නිවැරදි ව හා ක්‍රමානුකූලව අවබෝධ කරවිය හැක්කේ නම් සාර්ථක ප්‍රතිඵල ලැබෙනු ඇත.

## 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




ප්‍රස්තාරය 3.4

(1) හා (2) ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වුවද 1 ප්‍රශ්නයට අපේක්ෂකයින් 89.35%ක් පමණක් පිළිතුරු සපයා ඇත. එම ප්‍රශ්නයේ පහසුතාව 51%කි. 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන් ප්‍රතිශතය 87.1%ක් වන අතර එහි පහසුතාව 31%කි. අඩුම අපේක්ෂකයන් පිරිසක් එනම් 27.48%ක් තෝරාගෙන ඇත්තේ 05 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 42%කි. 5 ප්‍රශ්නයට අමතරව තෝරා ගැනීම අඩුම ප්‍රශ්නය 6 ප්‍රශ්නයයි. එය 31.03%ක අපේක්ෂක පිරිසක් තෝරා ගෙන ඇති අතර එහි පහසුතාව 24%කි.

සන්ධි හා තද්ධිත පිළිබඳ ව දැනුම 5 ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇති අතර 6 වන ප්‍රශ්නයෙන් සංඛ්‍යා පිළිබඳ අවබෝධය හා කර්මකාරක පිළිබඳ අවබෝධය පරීක්ෂා කර ඇත. මෙම කොටස සඳහා සිසුන්ගේ අවබෝධය වැඩි කිරීමට පෙළ පොත පරිශීලනය, පසුගිය ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීමේ හුරුව ලබාදීම මෙන්ම මතකයේ තබාගත යුතු කරුණු ක්‍රියාකාරකම් පාදක කොටගෙන පුනරීක්ෂණ කිරීම කළ හැකිය.

ප්‍රශ්න අංක 3 හා සැසඳීමේදී ප්‍රශ්න අංක 4, 5, 7 හා 8 යන ප්‍රශ්න 4හිම පහසුතාව වැඩි බව පැහැදිලි වේ. ප්‍රශ්න තෝරා ගැනීමේ දී අපේක්ෂකයන් බහුතරයක් එනම් 61.87%ක් පහසුතාව අඩු 3 ප්‍රශ්නය තෝරා ගෙන ඇත. 3 ප්‍රශ්නයෙහි පහසුතාව 35%කි. වර්ණමාලාව හා සන්ධි පිළිබඳ ව අවබෝධය පරීක්ෂා කර ඇති මෙම ප්‍රශ්නය අපේක්ෂකයන් බහුතරයක් තෝරා ගැනීමට හේතුව ලෙස කොටස් 3ක් ලෙස ලබාදී ඇති ප්‍රශ්නයෙහි පළමු කොටසට පමණක් අවධානය යොමු කිරීමෙන් ප්‍රශ්නය තෝරා ගැනීම හේතුවක් වී තිබිය හැකි ය. මක්නිසාද යත් සූත්‍ර සේ ලිවීමට ලබා දී ඇති එම (I) කොටසේ පහසුතාව 71%කි. එහෙත් ඉතිරි කොටස් 2හි පහසුතාව අවම අගයකි.

ඒ අනුව ලබා දී ඇති අමතර කාලය ප්‍රශ්න පත්‍රය නිවැරදි ව කියවා අවබෝධ කර නොගැනීම නිසා පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේ ගැටලු සහගත බවක් නිරීක්ෂණය වේ. අවසාන ප්‍රශ්න කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකර තිබීම ශිෂ්‍ය සාධනය අවම වීමට බලපා තිබෙන බව පැහැදිලි වේ.

සමස්ත II ප්‍රශ්න පත්‍රය කෙරෙහි අවධානය යොමු කිරීමේදී ප්‍රශ්න 8න් ප්‍රශ්න තුනක පමණක් පහසුතාව 50%ක් ඉක්මවා ඇත. ප්‍රශ්න අංක 1, 7 හා 8 එම ප්‍රශ්න වන අතර ඉතිරි ප්‍රශ්න පහම පහසුතාව 36%ක් හෝ ඊට අඩු අගයකි.

## 4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු

**පොදු උපදෙස්**

* ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතු ය. අනිවාර්ය ප්‍රශ්න හා තෝරාගත් ප්‍රශ්න වශයෙන් ද කොටස් හා අනුකොටස් වශයෙන් ද ප්‍රශ්න පත්‍රයට ගත වන කාලය පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.

* I පත්‍රයට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගෙන පැහැදිලි එක් කතිර ලකුණක් (X) පමණක් යෙදිය යුතු ය.

* II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී තෝරා ගන්නා ප්‍රශ්න අතරින් පහසු ප්‍රශ්න තෝරා ගත යුතු ය.

* II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

* ප්‍රශ්න කොටස් හා අනුකොටස් පිළිවෙළට යෙදිය යුතු ය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් සැපයිය යුතු ය.

* සෑම පිටුවකම අපේක්ෂකයාගේ විභාග අංකය හා පිටු අංකය යෙදිය යුතු ය.

* කෙටි පිළිතුරු කෙටි වශයෙන් ද දීර්ඝ පිළිතුරු දීර්ඝ වශයෙන් ද ලිවිය යුතු ය.

* පිළිතුරු සැපයීමේ දී එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරාගත යුතු ය.

* පිළිතුරුපත් ඇමිණීමේ දී පිටු අංක පිළිවෙළට ඇමිණිය යුතු ය.

* මුල් පිටුවේ විභාග අංකය විෂය හා පත්‍රය ආදී සඳහන් කළ යුතු විස්තර අනිවාර්යයෙන් ම ඇතුළත් කළ යුතු ය.

* II පත්‍රයේ ප්‍රශ්නවලින් නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට පමණක් පිළිතුරු සැපයීමට කාලය මිඩංගු කළ යුතු අතර, වැඩිපුර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට කාලය වැය නොකළ යුතු ය.

## 5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

* අත් අකුරු නිවැරදි ව හා නිරවුල් ව ලිවීමට ශිෂ්‍යයා යොමු කළ යුතු ය. අත් අකුරු ලිවීමේ අභ්‍යාසවල ශිෂ්‍යයා යෙදවිය යුතු ය.

* අක්ෂර හා අක්ෂර ප්‍රභේද, උත්පත්තිස්ථාන ආදිය විග්‍රහ වාක්‍ය ඇසුරින් ඉගැන්වීම කළ යුතු ය. පාඨ වාචෝද්ගත කළ යුතු ය. පාඨවල අදහස මාධ්‍ය භාෂාවෙන් ලිවිය යුතු ය.

* නිර්දිෂ්ට සූත්‍ර හා ගාථාවලට අර්ථ ලිවීමට අර්ථ පාඩම් කරවිය යුතු ය. තෝරාගත් ඡේදවලට හා ගාථාවලට අර්ථ ලියවා නිවැරදි කරවිය යුතු ය. නිර්දිෂ්ඨ පාඨ හා ගාථාවල අර්ථ පැහැදිලි කර දිය යුතු ය.

* ගාථාවලට අර්ථ සැපයීමේ දී අන්වය සකසා ගන්නා ආකාරය පෙන්වා දිය යුතු ය.

* නියමිත පාලි පාඨ ග්‍රන්ථයේ ඇති ඡේද හා ගාථා අර්ථ ගන්වා තේරුම් කර දිය යුතු ය. ඒ ඇසුරින් ප්‍රශ්න සකසා ඒවාට පිළිතුරු සැපයීමට සිසුන් යොමු කළ යුතු ය.

* ප්‍රශ්න පත්‍රයේ ඇති නිවැරදි නොවන පිළිතුරුවලට ගැලපෙන ප්‍රශ්න සිසුන් ලවා සකස් කරවීම මගින් ස්මරණය වැඩි කර ගැනීමට අවකාශ ලබාදිය යුතු ය.

* සරල මාතෘකා කිහිපයකට රචනා ලියවා එසේ රචනා ලිවීමට සිසුන් යොමු කළ යුතු ය.

* ප්‍රශ්න පත්‍රයේ ස්වරූපය පැහැදිලි කර දී පහසු ප්‍රශ්න තෝරා ගන්නා ආකාරය පෙන්වා දිය යුතු ය. අනිවාර්ය ප්‍රශ්න මග හැරිය යුතු නොවන බව අවධාරණය කළ යුතු ය.

* ලේඛන දුර්වලතා මඟහරවා ගැනීමට සතතාභ්‍යාසයේ යෙදිය යුතු ය.

* ව්‍යාකරණ, ඉගැන්වීමේ දී සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා නූතන ව්‍යවහාර ක්‍රමයක් සකසා ගත යුතු ය.

* ව්‍යාකරණ හුදකලාව නූගන්වා ව්‍යවහාරයේ වාක්‍යවල එන ව්‍යාකරණ තුළින් ව්‍යාකරණ ඉගැන්විය යුතු ය.

* විටින් විට ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියවා ශිෂ්‍යයා අභිප්‍රේරණය කළ යුතු ය.

* කටපාඩම් කරගත යුතු දේ වෙන් කොට ලබා දී ටිකෙන් ටික පාඩම් ගත යුතු ය.

* නිර්දිෂ්ට ග්‍රන්ථ හා කතුවරු පිළිබඳ තොරතුරු එක්රැස් කරවිය යුතු ය.

* නිපාත පද, උපසර්ග ආදි ව්‍යාකරණ කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

* ප්‍රතිඵල විශ්ලේෂණ වාර්තා සසඳා බලා සිසුන්ගේ දුර්වල අවස්ථා මොනවා දැයි තේරුම් ගෙන කටයුතු කළ යුතු ය.

* පාලි සංඛ්‍යා කෙරෙහි අවධානය යොමු කරවිය යුතු ය.

* පාලි භාෂාවේ දෛනික ව්‍යවහාර ඇසුරින් සංවාදයේ යෙදිය යුතු ය.

* ව්‍යාකරණ ඉගැන්වීමේ දී වාලාවකාර කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

ඉහත කී කරුණු අනුගමනය කිරීමෙන් පාලි විෂය සඳහා ශිෂ්‍ය සාධනය වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත.